එළිය

'දෙස රැස බස ගී - නොකරන පැණ යී'

4 වෙළුම | 1963 අප්‍රේල් - 2506 බක් | 1 කලඹ



පටුන

ලිපියුට

වැදගත් බස - මුනිදාස කුමාරණතුංග

දෑ පෙම - වෙල්ලාල ජයමහ

අප වැඩට ගන්නා නම්වර සැටිය - ඊලියන් ද සිල්වා [සොයුත් විදු (B. Sc. (Eng.) Lond.) A. M. I. E. E.]

නෝරුව - වි. ජ. මු. ලොකුබංඩාර (බදුල්ලේ දෙසිති උසාවියෙහි)

පැහැදුව -

සමතළ පාලම - අනඳපිය කුඩාකිහි (කොළොම්, යුදු හමුදු කම්දෙරුව)

ලොවුතුරු සුව - චන්ද්‍රා ආශුබෝධ

හෙළ ගැදි ආර - දි. වි. රිචඩ් සිල්වා [කලා විදු (B. A.)]

'පාරිභාෂික' පටලැවිල්ල -

දුහුනා පබඳ -

සැරැලිම - සඳදස් කෝපරහේවා (ගල්කිස්සේ සා. තොමොසු විදුහලේ සිත්තම් කලා ඇදුරු)

හෙළ සද - (W. D.) සිල්වා [කලා විදු (B. A. Lond.)]

අපේ මහ - අමරසිරි ගුණවඩු

බක් මස -

ඔබ විසින් මී ළඟට සිදු කිරීමට බලාපොරොත්තු වන පිංකම කුමන ප්‍රමාණයේ එකක් වුව ද එයට අවශ්‍ය

අටපිරිකර – පූජාභාණ්ඩ

විනයානුකූල ව ලබාගැනීමට
අප වෙත පැමිණෙන්න.

සීමාසහිත

ඩී. සී. ප්‍රනාන්දු සහ සමාගම

- ප්‍රසිද්ධ පූජාභාණ්ඩ වෙළෙන්දෝ
242 – 244 කෙළින් වීදිය
කොළඹ 11.

ටැලිෆෝන් 5098

ලිපියුව

තිරිසනාට වඩා හැම අතින් මැ ඉහළ අයුරෙකින් සිය හැඟුම් පවසන්නෙකි මිනිසා. එහි ලා ඔහු ගේ බලවත් මැ උවාරණය යි බස. හේ බසින් දොඩයි; ලියයි; සෙස්සනටත් ඒ අයුරින් මැ වැටැහෙන සේ සිය අදහස් පවසයි. මේ පැවැස්මට ඔහුට පිහිට වන්නේ වියරණය යි.

වියරණයක් සිංහලයට නුවූව මනා යැ යි කියන්නෝ අද වෙති. තමන් ගේ මැ පහසුව සලකා යැ යි සිතමි. බැලියැ යුත්තේ තමන් ගේ පහසුව නො වේ. වැඩි දෙනා ගේ යහපත යි. රැසේ නැහැදුණු අයට රටේ නීතිය කරදරයෙකි. බසේ නැහැදුණු අයට බසේ නීතිය කරදරයෙකි. මේ දෙ ගොල්ලන් ගේ පහසුව විනා පොදු ජන රැසේ, බසේ යහපත නො තකා නීතිය පිටු දකින්නට කවර නම් රජයෙක් කවර නම් සිහිමතෙක් සැරැසෙයි ද?

උසස් 'නිර්මාණ සාහිත්‍යයට' වියරණයක් නුවූව මනා යැ යි හඬා වැටෙන්නෝ ද වෙත් මැ යි. එ සේ වලපින්නෝ බසේ නුගතුන් වැ තමන් ලියූ දෑ ද උසස් මැවුම්කුරු ලිවිසැයියට නොවැටෙන්නා දුකැ ඒ හඬ නගනු නම් උනට අනුකම්පා කට යුතු යැ. එහෙත් එයට අයත් වියරණයක් නැති වැ ගෙයක් වත් හැදියැ හැකි ද ඇහ උඩ කඩා නොවැටෙන්නට? වියරණයෙන් මිතාර උසස් 'නිර්මාණ සාහිත්‍ය-යක්' ගැනැ කවර කතා ද ඉතින්?

අදහස වියරණයට එකඟ වූ පමණින් රටට දීම සුදුසු වේ ද? නො වේ. ඇයි? වියරණයෙන් කැරෙනුයේ අදහස නිරවුල් වැ පැවැසීම පමණක් වන හෙයිනි. අදහස නිරවුල් වූ පමණින් සියල්ල සපිරැණේ නො වේ. ඒ ඔබේ අදහස ඔබට වැඩක් ඇතිවා වියැ හැකි. එහෙත් ඒ එ සේ මැ වේ ද සෙස්සනටත්? ඔබේ අදහස ඔබට රසවත් වෙනවා වියැ හැකි. එහෙත් ඒ එ සේ මැ වේ ද සෙස්සනටත්? මෙන්න මෙ කරුණු සලකා බැලීමෙන් පසු වැ යැ අදහස වියරණයට එකඟ වූවත් රටට දීම සුදුසු වන්නේ.

අද රටේ මහ ගත් කරුවනැ යි පතළ කෙනෙක් වියරණයට හැවිලි හවති; සිය ගත්හි සිය පළේ වියරණ දොස් කෙනකු පෙන්නා දුන් විටැ වහා ඒ සකසා - ගනිති. වියරණයට හැවීමේ හේතු ඉන් මැ පැහැදිලි යැ! තව කෙනෙක් ණකලල වැට ඔනැ කමින් මැ බිඳි බව කියමින් උදම් වෙති. විලිත් නුවනත් මිසැ විලිත් නුවණත් දෙක ඒ ඇත්තනට නැති හෙයින් උදම් වියැ හැකි යැ! මේ අතරැ තව ද කෙනෙක් තමා ගේ රුසය අනුවැ හැදීම නොහැදීම යැ යි ද සැබියාව නො සැබියාව යැ යි ද ගෙනැ පොත් ලියති; පැලැඹෙති. අපේ ජන මූලේ හැදීමත් සැබියාවත් තව මැ ඒ තතුවට පහතට නොවැටුණු හෙයින් දේ යහතින් පැලැඹෙති. මෙ සේ බසට හැදිනාවට සැබියාවට එ මගින් මුළු ජන රැසට සතුරු වූවත් මැ රටේ මහ ලිපියුවනැ යි —ලේඛකයනැ යි— පාළ වීමේ හේතුව කිමෙක් ද? නියම ලිපියුවෙහි හෙවත් ලේඛකත්වයෙහි - ලකුණු අපේ මිනිසුන් හට පැහැදිලි නොවීම යි. මේ වරැ එහිය නියම ලිපියුවා — ලේඛකයා — කවරෙක් දැ යි ඔබට හඳුන්වාදෙයි

ඔහු ගේ ලිවීම බසේ වියරණයට එකඟ වියැ යුතු යැ. ඔහු ගේ අදහස්, රුසේ වියරණය වූ හැදීමට එකඟ වියැ යුතු යැ. ඒ හැදීම තව තව ඔප ලන්නා යැ නියම ලිපියුවා හෙවත් ලේඛකයා නම්; ඔප ලෑම යැ නියම ලිපියුව හෙවත් ලේඛකත්වය නම්.

* * *

ගව්'ගත වෙ පසස් - කඳු බස් කැරැ සකස්
පියෙසුව හට අත් හට - ගව බව මැ හුදු සාදු.

- සියබස්ලකර.

වැදගත් බස

මුනිදාස කුමාරණතුංගයන් විසිනි.

කය බස සිත යන තුන් තන්හි මැ වැදගත් බව වියැ යුත්තේ යැ. සිතෙහි වැදගත් බව මිනීම අමාරු යැ. ඇති සිත සඟවා, නැති සිතක් හඟවා, බසත් කයත් හසුරුවන්නන් බෙහෙවින් ඇති හෙයිනි. යමෙක් නොවැදගත් සිත සඟවා මැ වැදගත් බසත් කයත් පවසා නම්, එයින් අවැඩක් වනොත් ඔහුට මැ යැ. බැහැරැ ලොවට වැඩෙක් මැ වෙයි. වැදගත් බස ඇසූවෝ තමන් ගේ බස වැදගත් කරන්නට බලති. වැදගත් කය දුටුවෝ තමන් ගේ කය වැදගත් කරන්නට බලති. බස වැදගත් තන්හි කය වැදගත් තන්හි සිත ද වැදගත් වුව මැනැවැ යි හඟින්නෝ තමන් ගේ සිත ද වැදගත් කරන්නට බලත්.

කයෙහි වැදගත් කම ඇති වනුයේ තුන් වැදෑරුම් දුසිරිතින් වැළැකීමෙන් මැ නො වේ. වැදගත් වන්නට නම් කය පිරිසුදු කළ යුතු යැ. එහි වැසියැ යුතු තැන් වැසියැ යුතු යැ, පැහැදැවියැ යුතු තැන් පැහැදැවියැ යුතු. පිරිසුදු කය පිරිසුදු මැ වතිනි වැසියැ යුතු. කොතරම් පිරිසුදු වුව ද නොපිරිසුදු වතින් වැසුණු කය පිළිකුල් උපදවයි. 'මම පණීවා නො කෙරෙමි මම අනුන් අයත් ද නො ගනිමි. මම කයෙහි වරදවා නො හැසිරෙමි ඉතින් මම කයින් පිරිසුදු වුයෙමි නො වෙම් ද?' යි සිතා, කිලුටු කය පිරිසුදු නො කොටැ, පිරිසුදු වතින් නො වසා, හැසිරෙනුයේ මෙ ලොවැ දී නම් ගැරැහුම ලබයි.

සිවු වැදෑරුම් දුසිරිතින් වැළැකුණු පමණින් මැ බසෙහි වැදගත් කම වූයේ යැ යි යමෙක් සිතා නම් හේ මුළාවට වැටුණෙකි. බස හඬින් පිරිසුදු වියැ යුත්තේ යැ, වදනිනුදු පිරිසුදු වියැ යුත්තේ මැ යි. ඒ දෙ ලෙසින් මැ පිරිසුදු නුවූ බස වැදගතුන් ගේ සිත් ගැනීමට පොහොසත් නො වේ.

කෙසේ ද බස හඬින් පිරිසුදු වනුයේ? අකුරු හඬ පිරිසුදු ලෙස උපදවා පිරිසුදු ලෙස නික්මවා සතුටු නොසතුටු අදර අනදර කෝ සෝ විස්ම ඈ හැඟුම් හඬින් මැ හැඟැවීමෙන්, බස හඬින් පිරිසුදු වන්නේ යැ. අවර බස්හි කෙසේ වුව ද, හෙළ ඈ වර බස්හි එක් එක් අකුරට හිමි හඬෙක් වෙයි. එය වියැ යුතු සේ මැ නැංවියැ යුතු යැ. සතුටු නොසතුටු ඈ හැඟුම් ද හඬින් මැ හැඟැවියැ යුතු යැ. නොඑසේ වූ තන්හි නියම පිරිසුදු බසෙක් නො වේ. මේ බව අප අතුරැ කී දෙනෙක් සලකත් ද? හෙළ පා ඇලෙකැ නම් නියම පණ යොදා හඬ නඟා පොතක් කියවනු ඇසෙනොත් ඒ මහත් අරුමයෙකි. පණ තිබියේ වා නියම අකුරු හඬ වත් නඟන්නට බලන්නෝ කී දෙනෙක් ද? රැවැටිලි කරුවන් මැ රවටන්නට රූ සටහන් කිහිපයක් ඇඳැ තුබුව හොත්, නැටුමක් දැක්වුව හොත්, ගීයක් ගැයුව හොත්, එ තැනැ තමා සියලු හික්මීම! අහෝ, හෙළ රටට ලැබූ කුරිරු දසාවෙකැ දරුණු බව!

කෙසේ ද බස වදනින් පිරිසුදු වනුයේ? වැදගතුන් යොදන වදන් (words) යෙදීමෙනි. වැදගතුන් යොදන ලෙසට ඒ වදන් යෙදීමෙනි. 'වදන කුමක් වුව ද, අදහස වේ ද හැඟැවියැ යුතු' යැ යි නොවැදගත් වදන් යොදන්නේ නොවැදගතෙකි. එක් එක් වදන වැදගත් වුව ද, ඒ වදන් නොවැදගත් පිළිවෙළට යොදන්නේ ද, නොවැදගතෙකි. වැදගතුන් වැදගත් වදන් යොදන පිළිවෙළ යැ වියරණ නම්. එ හෙයින් වියරණය මරා වදන් යොදන්නේ නොවැදගතෙක් මැ යැ. හිණ කඩ වැදගත් ඇඳුමෙකි. උතුරු කඩ ද වැදගත් ඇඳුමෙකි. ඒ දෙක මැ හිසෙහි වෙළා, ඇඟ පත එළියේ ලාගෙනැ යන්නේ කෙසේ නම් වැදගතෙක් වේ ද? එ දෙකින් හිණ කඩ වෙළා බිමැ පෙරළෙන්නේ කෙසේ වැදගතෙක් වේ ද? එකක් දකුණතෙහි ද, අනෙක වම් පයෙහි ද දවටාගෙනැ යන්නේ කෙසේ නම් වැදගතෙක් වේ ද? දෙකින් දෙ අත පමණක් වසාගෙනැ යන්නේ කෙසේ නම් නම් වැදගතෙක් වේ ද? දෙකින් දෙ කකුල පමණක් වසාගෙනැ යන්නේ කෙසේ නම් වැදගතෙක් වේ ද? දෙක මැ නමා පොත් කොටැ හිස මතැ තබාගෙනැ යන්නේ කෙසේ නම් වැදගතෙක් වේ ද?

කුල සිරිත් නම් උසස් කොටැ සැලැකියැ යුත්තේ යැ. කුල සිරිත් බිඳැ හෙළුවෝ කුලයෙන් නෙරනු ලැබෙත්. එසේ මැ යැ කළ යුතුත්. කලට දෙසට නොමනා යැ සි හැඟෙන සිරිතක් වුව, සත්සුත් වැ සැසැඳිලි කොටැ සිරිත මනා කොටැගැන්ම එකෙකි. සිරිත් රකින්නට නොපොහොසතකු, තමා නොපොහොසත් බැවින්, මනා සිරිත් කඩා බිඳැ හෙළීම අනෙකෙකි. කුල සිරිත් බල ලබනුයේ කුල දෙටුවන් ගෙනි.' කුල' (Society) යනු මෙහි සුදුසු මැ අරුත දෙනු කොටැ ගත යුත්තේ යැ.

වදත් සිරිත ද මෙයට නොදෙවැනි යැ. වදත් සිරිත් බිඳැ හෙළුවෝ වදත් දනු මඬුල්ලෙන් නෙරනු ලැබෙත්. එ සේ මැ යැ කළ යුතුත්. කලට දෙසට නොමනා යැ සි හැඟෙන වදත් සිරිතක් වුව, සත්සුත් වැ සැසැඳිලි කොටැ සිරිත මනා කොටැගැන්ම එකෙකි. සිරිත් රකින්නට නොපොහොසතකු, තමා නොපොහොසත් බැවින්, මනා සිරිත් කඩා බිඳැ හෙළීම අනෙකෙකි. වදත් සිරිත් බල ලබනුයේ වදතිසුරන් ගෙනි. එහෙත් දූත් වෙනසෙකි. වදත් බැළයෝ තැන් කෙරෙති, වදති'සුරු බව තිකම් මැ කරට ගන්නට. ඉංගිරිසි අත්දර පොතක් කියැවුයේ හෙළුවට රුසියෙකි. ඉංගිරිසි සරසවියෙකැ පටක් බැඳැගත්තේ හෙළුවට සුර ගුරෙකි. එ බඳු රුසි කමක් සුර ගුරු කමක් කරන්නට හෙළුව දනීමෙන් කම් නැති. තමන් හෙළුව දන්නා බව තමන් මැ කීම් පමණ වෙයි. නව ද කළ යුත්තෙක් ඇති. එ නම් හෙළුව නිසි පරිදි දන්නවුන් ගරි මැ මෝඩයන් බව රට කරවන්නනට කියාදීම යි. රට කරවන්නෝ හෙළුව නො දනිති. හෙළුව ගැනැ යම් කිසි විනිසිනුමක් කළ මනා නම්, අර පට බැඳි පඬුවන් විමසා, උන් කී දූයක් පිළිගැනීම යැ සිරිත.

පට බැඳි පඬුවනටත්, ඉංගිරියෙන් පඬුවන් වන්නට තනතන්නවුනටත් සැබැ මැ හතුරු කම් ඇති වනුයේ බසෙහි වැදගත් කමිනි. බසට වැදගත් කම ලැබෙනුයේ වියරණයෙනි. වියරණය නැත හොත්, ඔවුන් වහරවන බස නමා බස! එ හෙයින් කළ යුත්තේ වියරණයට විරුදු වැ සටන් කිරීම යැ මේ හැඟීමෙන් දූත් රට පඬුවෝ වියරණය වියරුවක් බව පවසති. වංගයටත් වියරණ නැති කලැ, හින්දියටත් වියරණ නැති කලැ, ඉංගිරිසියටත් වියරණ නැති කලැ, ප්‍රංස, රුසියා ආදි බස්වලටත් වියරණ නැති කලැ, කුමට ද හෙළුවට පමණක් වියරණය? මේ යැ බලවත් පැතය මෙය නැඟූ කලැ සියලු නිවටයෝ වෙවුලා ගොස් නිහඬ වෙති 'අර ගොරවුවෝ ලොවැ ඇති තාක් සියලු බස් දන්නෝ නො වෙත් ද? නො වෙත් නම් ඔවුන් කෙසේ ද අර බසටත් මේ බසටත් වියරණයක් නැති බව කියන්නේ? සැබැවිනුත් සැබැවෙකි. සෙසු මුළු ලොවට මැ එපා වූ වියරණය කුමට ද අපට? මෙ සේ සිතමින් නිවටයෝ තමන් දන්නා වියරණය ද පිළිකුල් කොටැ සිතන්නට වෙත්.

සැබැව නම්, වියරණයක් නැති බසක් මුළු ලොවැ කිසි තැනෙකැ නැති බව යි. බසක් නැඟෙනුයේ වියරණය පිටැ යැ. බසෙහි මතු නො වේ. ලොවැ කවර පැවැත්මෙකැ වුව ද වියරණයෙක් වෙයි. වළන් තැනීමෙහි වියරණයෙක් වෙයි. කුඹුරු අස්වැද්දීමෙහි වියරණයෙක් වෙයි. ගැල් පැදවීමෙහි වියරණයෙක් වෙයි. කිමෙකැ ද වියරණයෙක් නොවනුයේ?

මේ පුදුම රටෙකි. නොදැනීම යැ මෙහි ඉතා උසස් දැනීම? රට කරවන්නෝ හෙළුව නො දනිති. හෙළුව දන්නකු ලෙස යමෙක් ඔවුනට පැටැවිණි නම්, ඔහු නොදන්නකු බව දැනැගැනීමට රට කරවන්නෝ කිසි සේත් නො සැරැසෙති. යම් කිසි සැහැසියෙක් ඉදිරියට පැනැ, 'අර හෙළුව නොදන්නෙකැ' යි කියුව හොත්, රට කරවන්නෝ ඒ නොදන්නා අතින් මැ ඔහු දත් නොදත් බව විමසත්. 'මම සියල්ල දනිමි' යි ඔහු කියන්නා පමණි.

නව ද අවුලෙකි. තමන් නොදත් බව සඟවා, දත් බව මැ හඟවා, රට රවටන්නවුන් අතුරෙහි වැඩි දෙනෙක් බෝසත් ගුණ දක්වන්නෝ යැ. ඔහු හෙළ මෝඩයනට නිවන් යන්නට මහ මං තනති, තනවති, මුළු දවස මහ දනා මෙහෙයට මැ ගෙවන බව ඉඳුරා දක්වති, ඒ සියල්ල බැළ පමණකුදු නො ලැබැ කරන බව ද හඟවති. ඉතින් නොරැවැටෙනුවෝ කවරහු ද?

එහෙත්, අහෝ, 'අහෝ මගේ රට! අහෝ, මගේ ජාතිය! මා මේ බඳු මහ සොර කමක් කළ කලැ මගේ අසරණ ජාතියට යන කල කෙබඳු වේ ද?' යනු වැන්නක් මේ මහ ලෝ සොරුන් ගේ සිතට වරක් වත් නොවදිනු වේ ද මහත් මැ පුදුමය!

සිංහලය වැදගත් ලෙස හසුරුවන්නට නොදන්නා, විළි නැති, මහ කුහුවන් ගේ මහ තකුවෙක් නමා, 'වෙන උසස් බස්හි වියරණයෙක් නැතැ' යනු. මේ තරම් මහ බොරුවක් කියැ නොහැකි යැ. මේ මහ බොරුව කියන්නෝ හොඳ කපට කමක් කෙරෙති. එ නම් තමන් වත් අසන්නවුන් වත් නොදන්නා, බසක් අල්ලා - ගැනීම යැ ප්‍රංසයේ රුසියාවේ උගතුන් වියරණයට පයින් ගසති යි එකෙක් කිල. එය අසන මහ මෝඩයෝ එය කියන්නා, ප්‍රංස බසත් රුසියා බසත් ඉතිරි නො කොටැ දනිති යි විස්මති, 'අපිත් වියරණයට පයින් ගසා උගත්තු වම්හ' යි සිතති. සිය දූන් වැරැදි හසරින් මුදුගත නොහැකි වූ නිවටයෝ, 'උන් තිඳුල්ලේ හැරීම උසස් ජාතිවලැ දූන් සිරිත යැ' යි කියති. එ බඳු මැ නිවටයෝ තවත් වෙත් නම්, ඒ කියමන පිහිට ලබයි. එහෙත් වැදගත් පරපුරින් ආ, වැදගත් ලෙස පවත්නා මාපියෝ සිය දූන් වැදගත් ලෙස මැ රැකැ, වැදගත් ලෙස මැ හසුරුවා, වැදගතුනට මැ වැදගත් ලෙස පාවා දී, සිය යුතු කම කෙරෙත්. තැනීමේ කරදරයෙන්, දීමේ කරදරයෙන් මිදීමට හොඳ මැ හොඳ උවය නම් දූන් තිඳුල්ලේ හැරීම යැ. බස ඉගැනීමේ කරදරයෙන්, විමැසීමේ කරදරයෙන් පුරුදු කිරීමේ කරදරයෙන් පෙහෙණීමේ (පෝෂණය කිරීමේ) කරදරයෙන්, සේදීමේ කරදරයෙන්, සැරැසීමේ කරදරයෙන්, රසවත් කිරීමේ කරදරයෙන් මිදෙනු පිණිසැ, බස තිඳුල්ලේ හරින්නට සිතන්නවුන්, සිය දරුවන් කෙසේ හසුරුවත් දැ යි රහසින් විමසා බැලීම ඉතා සුදුසු වෙයි.

තවත් සොයා බැලියැ යුත්තෙකි. සිතට කටට එන ලෙසෙකින් මැ බස වැහැරැවියැ යුතු යැ යි කියන්නවුන් අතරැ, නිවැරැදි ලෙස බස හසුරුවන්නට දන්නා එකෙක් පමණ වත් වේ ද? නො වේ නම්, එහි කාටත් සිතාගත හැකි රහසෙකි. මුඩුවෝ මැ 'කෙස් නැති බව යහපතැ' යි කියත් නම්, අඳහු මැ 'ඇස් නැති බව මැනැවැ' යි පවසත් නම් රහස කාට නො තේරේ ද? බස නොදත්තෝ මැ වියරණය නො රුසිත් නම්, රහස කාට නො තේරේ ද? හැයි, බස දන්නා එකකුත් වියරණයට හැවිලි නොහවත්තේ? වරද්දවරද්දා, බණක් දෙසූ පමණින්, පොතක් සැකැසූ පමණින්, පොතක් සැලැසූ පමණින්, බස දතුවෙක් නො වේ. දූන් මෙ රටැ මෝඩයාට හැම අතින් පෙනෙනුවෝ උගත්තු යැ. නිමට කමෙකැ මහත!

ඉංගිරිසිය වියරණයක් නො සලකා වැහැරැවෙන බසෙකැ යි නුනුවණනු හඟිත්. මහ මුළාවෙකි. ඇත්ත නම් ඉංගිරිසියෙහි පමණ දිග පළල බොල ඇති වියරණයෙක් මුළු ලොවැ අන් එක ද බසකට නැත්තේ යැ යනු යි. වියරණයක් නැති බසෙහි වරදක් කළ නොහැකි යැ. විසි තිස් හවුරුද්දක් මැ ඉංගිරිසිය පුරුදු කෙළේ ද නො වරදවා එ බස වැහැරැවීමේ නොපොහොසත් වේ. හැයි? එහි වියරණය එ තරම් සියුම් යැ. ඉංගිරිසි ඉගැනීම ඇරැඹෙනුයේ තුන් හැවිරිදි කලැ යැ. එත් විසි හැවිරිදි වන තෙක් ගෙදරැ දී ද මගැ දී ද පා සලෙහි දී ද එය මැ පුරුදු කරනු වෙයි. එ සේ ද කොටැ කොළුවරැ දී පළ වනුයේ ඉංගිරිසිය මැනැවින් නොදත් බව යි හැයි? එහි වියරණය එ තරම් සියුම් යැ. එ තෙක් කල් යවා ද ඉංගිරිසිය මනා සේ යොදන්නට නොදත් මෝඩයෝ, දත් බව හඟවන්නට සිංහලයට හැරෙති! 'ඉංගිරිසියෙහි වියරණයෙක් නැති එ හෙයින් එ බස දිනෙන් දිනැ දියුණු වෙයි. සිංහලය ද දියුණු වන්නට නම් වියරණයට පයින් ගැසියැ යුතු යැ' යි කියති මෝඩයෝ රැවැටෙති.

හොඳින් මැ සිංහලය යොදන සැටි උගන්නට ස මස ද වැඩි කලෙකි. ඉංගිරිසිය නම් එ සේ ඉගැනීමෙක් නො වේ. සුදු ගෙදරෙකැ බැළ මෙහෙයකට වත් සැහෙන පමණ ඉංගිරිසිය උගන්නට එයට වඩා දිගු කලක් වුව මනා යැ. සිය බස දතුවන් සේ පාළු වන රිසියෙක් වේ නම්, ඇයි එය උගන්නට ස මසක් නොගෙවන්නේ? ලොවැ අන් හැම බසට මැ වඩා වැඩි, ලිය ලා, වැඩී, හෙවී, බෝ වී සිටි සකුව උගන්නට ද ස මස සැහේ නම්, සිංහලය උගන්නට ඒ හොඳට මැ

සැහේ. එ තරම් සුළු කලෙකිත් මැනැවින් මැ උගත හැකි බස ඉගැනීම තබා, තමනට නැති උගත් කම් ඇති ලෙස ගහවන අවියෙන්, සිය බසේ ගුණ මකා, දෙස් වකා, රස වළකාලන්නට තැත් කරන්නෝ, බසට පමණක් නො වැ, දැයට පමණක් නො වැ, මුළු ලොවට මැ මහ හතුරෙකි.

වැදගත් බව රැකැගන්නට තැත් කරන්නෝ වැදගත්තු යැ. නොවැදගතුන් ගේ දුසිරිත් බලා වැදගත්තු පහළට නො බසිති. වැදගත් බව පතන්නවුන් විසින් කළ යුත්තේ, නොවැදගතුන් ගේ දුසිරිත් අනට නො හැරී, වැදගතුන් ගේ සුසිරිත් බලා පුරුදු කිරීම යි. අන් සියල්ලෙහි මෙන් මැ බසෙහි ද වැදගත් කම යැ බුහුමන් ලබනුයේ.

[සුබසෙහි 2 වෙළුමෙහි *II* කලඹින් (1940. 10. 21)
උපුටුණේ කුමාරතුංග ගෝමින් ගේ
අවසරයෙනි.]

× × ×

මිතුරා : ඔබේ මාමා මැරෙන මොහොත තෙක් මැ හොඳ සිහියෙන් ද සිටියෙ?

උරුම කරු : එය දැනැගන්නට පුළුවන් වන්නේ ඔහු ගේ අන්තිම කැමැත්තේ ඇති දෑ අසා දැනැගත්තාසින් පසු වැ නො?

දෑ පෙම

වෙල්ලාල ජයමහ

රටට දෑසට පත් දැකැ සතුරු උවදුරු
හදට කවා දිරු විරු ගුණ මුළු උතුරු
යුදට දෑය මැ දුවවන පැ මරුට මරු
ඔබට සම කෙනෙක් දෑ පෙම ලොවැ කවුරු?

මෙතෙක් ගැළු අතරක් නැති රිපු විතුරේ
කු ණ ක් කැරැ නොයා දී පිරිහුම් සයුරේ
දෑ ය ක් ලෙස මෙ ලෙස වත් අප රැකි මිහිරේ
ම ල ක් කෙරෙම් මගෙ හද ඔබ ගෙ පද සරේ

ව දි න වදිනවුත් ගනුව සි ලෙසට පණේ
කි ය න නුවණ මොට නිවටුත් වනසු බණේ
ස ව න අද දුනොත් හෙට දිනැ දෙමළු .හෙණේ
හ සි න ම-රට දෑය සිහි වන හද මැ වණේ

දෑ පෙම හැසුවෝ ද ඔබ යම් බිමැ දරුවෝ
ඒ බිම එ තන් සිටැ නොපහළ වෙති විරුවෝ
නෑ කම දුටු-දුටුවනට කියනට සුරුවෝ
උඹ හැම වෙති නිකම් දෑ-මරු බඩ-බරුවෝ

ගි හි ව ත් පුරා රැකැ පවට මැ වෙමින් නතු
රකිනොත් සල නිසල වත් හැම තමන් සතු
නැතිමෙත් පැපැ පරනට නො බැණැ බොරු ගතු
රැකැ-ලත් මැනැවි රට දෑ දෙක ද මතු මතු

හැම සත්හු මැ සුව පත් වෙත් වයි එක සේ
ස ම මෙත් කරන්නට තුන් ලොව මැ ලා හිසේ
න ම ලැබැ රහත් මොක් පද ගැසෙන තුරු ඇසේ
හි ම සෙල අපේ හැම දෑ රැකැ-ලමු දිවි සේ

වැ ටුණු ,ලෙසක් පැ කුස තුළැ ගිනි අඟුරු
වැ දුණු වැදුණු හැම තැනැ බැණැ බණ ,පියරු
රැකුණු මෙ නෙක් බස රැස දෙස තුනට මරු
ප මුණු වනුව නො ගනිමු දහම බඩ-බරු

සි ලුත් ගනුමු සිරි සඟබෝවන් විලස
සු දත් කෙරෙමු විරු දෙටු ගැමුණුවන් ලෙස
ර වත් දෑයන් රැකැ-ගෙනැ විලසින් දෙ ඇස
අ පිත් මැරෙමු ලොවැ හරි මිනිසුන් වැ වැස

(එළිය 1949, 2 වෙළුම 2, 3 කලප්)

අප වැඩට ගන්නා නම්වර සැටිය

ජූලියන් සිල්වා

අප වහරවන නම්වර වැල මුළු මිනිස් වගට මැ පොදු යැ. ඒ නම්වර වැලෙහි ඉලක්කම් "අරාබි ඉලක්කම්" සේ හැඳින්වුව ද එහි උපත වූයේ අරාබියෙහි නො වැ ඉන්දියා පෙදෙසෙහි බව පිළිගත් කරුණෙකි. ඈත කාලයේ සිටැ මැ අන් රටවල් හා වෙළෙහෙළෙඳමෙහි යෙදුණෝ යැ අරාබි ජාතිකයෝ. එ බැවින් උන් අතරේ ද වහරට ගිය මේ ඉලක්කම්, අපර දිගු වැසියන් අතට පත් වූයේ අරාබි මිනිසුන් ගෙනි අපර දිගු වැස්සෝ ඒ ඉලක්කම් අරාබි ඉලක්කම් ලෙසැ සැලැකූ හ. අද ද, බොහෝ දෙන එ සේ මැ සලකත්.

අප වැඩට ගන්නා මේ ඉලක්කම් හැරුණු විටැ පළට ගිය තව ද ඉලක්කම් වගෙක් වේ. "රෝම ඉලක්කම්" ලෙසැ හැඳින්වෙන ඒ ඉලක්කම් ඇති වූයේ ඉතාලියේ යි "රෝම ඉලක්කම්" අප වැඩට ගනුයේ සුළු වසයෙනි. ඉදැ - හිටැ ඔරලෝසුවෙකැ දක්වෙන මේ ඉලක්කම්, පොතෙකැ පිටු නම්වර කැරුම්, කැඩි නම්වර කැරුම් ආදියට යෙදේ. එහෙත් ගණිත - මිනිත ආදියෙහි දීත් එ දිනෙදා කටයුත්තෙහි දීත් බෙහෙවින් යෙදෙන්නේ අරාබි ඉලක්කම් වෙයි අපරදිගු වැසියන් දනැ - හැඳිනැ සිටි රෝම ඉලක්කම් මැඩැ අරාබි ඉලක්කම් ඉස්මතු වූයේ කෙසේ දැ යි විමැසියැ යුත්තෙකි.

අරාබි නම්වර සැටිය ඉලක්කම් දසයෙකින් සැදුණේ වෙයි. 0, 1, 2, 3, 4, 5, 6, 7, 8, 9, යනුවෙනි. මේ එක් එක් ඉලක්කමෙහි එක් එක් වටිනාකම් වෙයි. එහෙත්, ඉලක්කමෙකැ වටිනාකම රඳා - පවත්නේ තව ද කරුණක් මතැ යැ '1' යන ඉලක්කම් සලකුණ ගෙනැ බලමු මෙ මැ සලකුණ එක් තැනෙකැ යෙදූ කලැ එහි වටිනාකම එකෙක් වෙයි. එහෙත්, එය එක් පියවරක් වම් පැත්තට ගෙනැ - ගිය හොත්, එහි වටිනාකම දසයෙකි. තව ද පියවරක් වමට ගත් කලැ වටිනාකම සියයෙකි. මෙ සේ එක් එක් පියවර බැගින් වමට ගෙනැ යන විටැ වටිනාකම දස ගුණය බැගින් වැඩි වෙයි. නිදසුන් වසයෙන්, '15' යන්නෙහි '5' යන සලකුණෙහි අගය පසෙකි. එහෙත් '51' යන්නෙහි '5' යන සලකුණෙහි අගය පනසෙකි මින් පෙනෙනුයේ අරාබි නම්වර සැටියෙහි ඉලක්කමෙකැ අගය කරුණු දෙකක් මතැ රඳා - පවත්නා බව යි. එකෙක් නම් ඉලක්කමට දී ඇති තැන කරණ කොටැ එයට ඇති වන වටිනාකම යි. යෙදී ඇති තැනේ හැටියට අගය වෙනස් වන ඉලක්කම් ඇති නම්වර සැටි හඳුන්වනුයේ "තැන් - ඇගි නම්වර සැටි" යනුවෙනි. (Place - Value Number System).

රෝම නම්වර සැටියත් තැන් - ඇගි නම්වර සැටියෙක් දැ' නැති, මඳක් විමසා බලමු රෝම ඉලක්කම් වැලෙහි එකක් හැඳින්වනුයේ 'I' යන්නෙනි, පහක් හැඳින් වෙනුයේ 'v' යන්නෙනි නම්වරය 'vi' සේ යෙදූව ද, 'iv' සේ යෙදූව ද' 'v' යන ඉලක්කමෙහි අගය පසෙක් මැ වෙයි. තැන වෙනස් වුව ද අගයෙහි වෙනසෙක් නැති. එහෙත්, අරාබි ඉලක්කම් සැටියේ නම් එක් මැ ඉලක්කම් සලකුණ එහි මැ දස ගුණය, සිය ගුණය දහස ගුණය ආදිය නොහිමය (Infinity) දක්වා හඳුන්වයි. නිදසුන් වසයෙන්, '5' යන ඉලක්කම් සලකුණ 5, 50, 500, 5000 ආදිය නොහිමය දක්වා හඳුන්වයි. රෝම ඉලක්කම් සැටියේ නම් මෙ සේ සියල්ල එක් සලකුණෙකින් හැඳින්වියැ නොහැකි යි. එ බැවින් රෝම නම්වර සැටිය යොදත් හොත් ඉමක් - කොනක් නැති ඉලක්කම් රැසෙක් ඇවැසි වෙයි මෙන්න මේ නිසයි රෝම නම්වර සැටිය, අරාබි නම්වර සැටියට ඉඩ දී අයින් වූයේ.

ඉහතැ දක්වූ සේ අරාබි නම්වර සැටියේ ඇත්තේ ඉලක්කම් සලකුණු දසයෙකි.

ඉපැරැණි ජාතීන් බෙහෙවින් වැඩට ගත්තේ ඉලක්කම් සලකුණු දසයෙකින් යුත් නම්වර සැටි වග, පුරාවිද්‍යා පිරියෙසුම් පෙන්වයි. යම්කිසි තැන් - ඇගි නම්වර සැටියෙකැ පදනම වසයෙන් ඉලක්කම් දසයක් මිසැ අන් ගණනක් ගත නොහැක්කේ ද? නැති, කිනම් ඉලක්කම් ගණනක් වුව ද පදනම් කොටැ තැන් - ඇගි නම්වර සැටියක් නිපැදැවියැ හැකි වෙයි එ සේ නම්, ඇයි ද ඉපැරැණි තැන් - ඇගි නම්වර සැටි බොහොම යක් මැ ඉලක්කම් දසයක් පදනම සේ ගෙනැ තැනුණේ? මෙයට හේතුව නිසැකයෙන් දැක්වියැ නොහැකි යි ආදි යුගයේ මිනිසා එකකට වඩා යමක් හැගැවීමට අනෙහි ඇගිලි වහල් කොටැ ගත්තේ යැ යි හැගේ. දැනෙහි වූයේ ඇඟිලි දසයක් බැවින් ඔහු ගේ ගිණුම් දහය ඉක්මවා නොගිය සමයක් ද වූ හ යි ගත හැකි. ලිවීම වටහා-ගත් අවදියේ ඒ දසය ඉලක්කම් සලකුණු දසයෙකින් හඳුන්වන්නට ඇති. තව ද කලක් ගිය පසු, ගිණුම දියුණු වත් මැ මේ ඉලක්කම් දසය පදනම සේ ගෙනැ තැන්-ඇගි නම්වර සැටියක් සාද-ගන්නා වන්නට පිළිවනි.

මේ අයුරින් සිතන, බලන, ඉපැරැණි සිංහලයා ද තම නම්වර හැඳින්වීමට යෙදූ නම් සලසා ගත්තේ කෙසේ දැ යි වටහාගත හැකි වෙයි. දුම් ඔලොස්ස යනුවෙන් හැඳින්වෙනුයේ දුම් අල්ලන බඳුන යි. ඔලොස්ස යනු බඳුන් වෙසසෙකැ නම්. අත් දෙක ඔලොස්සෙකැ හැඩයට තුබූ විටැ එනුයේ 'අත් ඔලොස්සෙකි', හෙවත් අතලොස්සෙකි. අතලොස්සෙකැ ඇගිලි දසයෙක් වෙයි අතලොස්ස යන්නෙහි 'අත' යන්න හැළී දහය හඳුන්වන්නට 'ලොස්ස' යන්න යෙදුවා වියැ හැකි යි. එ විටැ, එකක් වැඩි ලොස්ස 'එකලොස්ස' ද, දෙකක් වැඩි ලොස්ස දෙලොස්ස' ද, තුනක් වැඩි 'ලොස්ස' තෙලොස්ස ද වී, එය මැ එකලොස, දෙලොස, තෙලොස ආ විසින් ගැනෙන්නට ඇති.

දහය පදනම් කැරැ නම්වර සැටි තැනුණේ මිනිසාට ඇගිලි දසයක් වූ හෙයිනැ යන්න සබා නම්, යම් හෙයෙකින් මිනිසාට ඇගිලි අටෙක් වූයේ නම් අපට නම්වර සැටියෙක් නොලැබෙන්නේ ද? ලැබෙන්නේ මැ යි, එහෙත් මඳක් වෙනස් ලෙසකිනි. එ විටැ වනුයේ 0, 1, 2, 3, 4, 5, 6, 7, යන සලකුණු අටයි. අටක් හඳුන්වන නම්වරය '10' වෙයි. නවයක් හඳුන්වන නම්වරය '11' වෙයි දහයක් හඳුන්වන නම්වරය '12' වෙයි. මෙ ලෙසින් ඇති වෙයි නව තැන් - ඇගි නම්වර සැටියෙක්. මින් කිමෙක් හෙළි වේ ද? එකකට වැඩි සලකුණු කිනම් ගණනක් වුව ද පදනම සේ ගෙනැ තැන් - ඇගි නම්වර සැටියක් නිපැදැවියැ හැකි වග ද, පදනම සේ ගත් සලකුණු ගණනට ඒ නම්වර සැටියේ ඉලක්කම් ගණන සම වන වග ද, පැහැදිලි වෙයි.

අප වහරවන නම්වර සැටියට අගෙක් හෝ මුලෙක් හෝ නැති. එහෙත් බින්දුව පටන්ගැන්ම සේ ගත හොත් උඩනට දන නොහිමයක් (Positive Infinity) තෙක් ද පහනට රිණ නොහිමය (Negative Infinity) තෙක් ද පැතිරී සිටී නම්වර සැටිය. මෙ සේ ඉමක්-කොනක් නැති නම්වර ගණනාවක් මැ ඉලක්කම් දහයක් පමණක් යොදා දැක්වියැ හැකි වග මැ අසිරි යැ. වැඩි කිරීම, එකතු කිරීම, බෙදීම, අඩු කිරීම යන නොයෙකුත් විදි යොදා නම්වර සැටියෙන් වැඩ ගැනුම කැරෙයි. මෙ එක් එක් විදියට පිළිගත් පිළිවෙළ වෙයි එහෙත් සමහර තැනැ දී පිළිවෙළින් පිට පැනුම පහසුවට කරුණු වේ මැ යි. නිදසුනක් ගෙනැ බලමු. 68 × 62 යන්න විසඳන සැමැති පිළිවෙළ කවුරුත් දනිති. මෙ වන් තැනැ දී නියරින් පිට පැනුම පහසුවට හේතු වෙයි. එකු පිලෙහි ඇති ඉලක්කම් දෙක 8 හා 2 හා වෙයි. දසැ පිලෙහි ඉලක්කම් දෙක මැ 6 වෙයි 68 × 62 යන්න විසැඳුම මෙ සේ කළ හැකි වෙයි එකු පිලේ ඉලක්කම් දෙක වැඩි කළ කලැ එනුයේ 8 × 2 = 16 යි ඉක්බිති මැ දසැ පිලේ ඉලක්කම වන 6 නම්වර වැලෙහි ඊළඟ ඉලක්කම වන 7න් වැඩි කළ කලැ 6 × 7 = 42යැ. එ විටැ 68 × 42 = 4216 සේ එක්වරැ මැ ලිවියැ හැකි. මෙ සේ විසැඳියැ හැක්කේ සමහර නම්වර පමණි. එය මෙ සේ යි. වැඩි කැරුමට ඇති නම්වර දෙකෙහි දසැ පිලෙහි එක් මැ ඉලක්කම වියැ යුතු, එකු පිලෙහි ඉලක්කම් දෙක එකතු කළ කලැ දහය විය යුතු යි. මෙය වෙසෙස් වාසියට හේතු වනුයේ 25^2; 35^2; 45^2; 55^2, 65^2; ආදී දෑ විසඳන්නට

ඇවැසි වූ විටැ සි. 85^2 යන්න ගනිමු 5 × 5 = 25 සි; 8 × 9 = 72 සි එවිට 85^2 = 7225 සි. මේ අයුරැ තව බොහෝ දෑ ඇති, නම්වර වැලින් වැඩ ගැනුම පහසු කරවන.

නම්වර වැලින් වැඩ ගැනුම පහසු කැරුම සඳහා නොයෙක් පන්නයේ යන්ත්‍ර ද නිපදවා ඇති මේ යත් අතුරින් එකතුකුරැ යන (Adding machine) ගැනැ බොහෝ දෙනා අසා ඇති. එකතුකුරැ යන අද-ඊයේ උපන්නෙක් නො වේ. චිනය, ජපානය ආදී රටවලැ ඉපැරැණි කල් සිටැ මැ එකතුකුරැ යත්වලින් වැඩ ගැනුණේ සි. ඒ රටවලැ එදා යෙදුණු එකතුකුරැ යත් ඒ ලෙසින් මැ අද ද වැඩට ගැනෙයි. එ මැ යන ගිණුම්-රාමුවෙකි. ජපනුන් එයට දෙන නම "සොරොබානය" යනු සි. ලිහිල් පන්නයේ සොරොබානයක් පළමුවැනි සටහනෙන් දැක්වෙයි එහි හරස් පෙළ සයෙකි හැම පෙළෙකැ මැ පබළු දහ-යෙකි ඉහළ මැ පෙළ එකු-පිල ද, දෙ වැනි පෙළ දසැ-පිල ද, තෙ වැනි පෙළ සිය-පිල ද, සිව් වැනි පෙළ දහසු-පිල ද යන ආදී වස-යෙන් ගත යුතු. එ බැවින් දහය පදනම් කොටැ තැනුණු තැන්-ඇඟි නම්වර සැටි-යෙකැ වෙස් පායි මෙ මැ සොරොබානය. කිසියම නම්වරයක් දැක්වීමට පෙරැ සියලු පබළු වම් පසට කළ යුතු සි 325 යන නම් වරය දක්වන්නට රිසි යැ යි සිතමු ඉහළ පෙළින් පබළු පහක් ද, දෙවැනි පෙළින් පබළු දෙකක් ද, තෙවැනි පෙළින් පබළු තුනක් ද දකුණත් පසට ගෙනා යුතු යැ පළමු වැනි සටහන මෙය පැහැදිලි වැ දක්වයි. මෙ සේ දැක්වූ 325 යන නම්වරයට 137 යන නම්වරය එකතු කරන්නට රිසි යැ යි සිතමු එ විටැ ඉහළ පෙළේ තව ද පබළු හතක් දකුණට ගෙනා යුතු සි. එහෙත්, වමෙහි ඇත්තේ පබළු පහක් පමණි. මෙ වන් තැනැ දී ඒ පහ දකුණතට ගෙනා යුතු සි එ විටැ දකුණේ පබළු දසයෙකි. එහෙත් දෙවැනි පෙළේ එක් පබළුවක් දකුණට ගත් කලැ ඉහළ පෙළේ පබළු දහය නැවත වමට ගෙනැ යා හැකි සි. පබළු හතක් ඉහළ පෙළේ වමට ගෙනැ යා යුතු වැ තිබුණ ද ගෙනැ ගියේ පබළු පහක් පමණි. දැන් ඒ ඉතිරි පබළු දෙක ද ඉහළ පෙළේ වමට ගෙනැ යා හැකි වෙයි ඉක්බිති වැ දෙවැනි පෙළේ පබළු තුනක් වමට ගෙනැ යනු. ඊළඟට, තෙවැනි පෙළේ එක් පබළුවක් වමට ගෙනැ යනු. දැන් එකතු කැරුම නිමාර යැ. ඉහළ පෙළේ පබළු දෙකෙක් ද, දෙවැනි පෙළේ පබළු සයෙක් ද, තෙ වැනි පෙළේ පබළු හතරෙක් ද වෙයි. සොරොබානයෙහි වම් පසැ. මින් දැක්වෙන නම්වරය නම් 462 යන්න සි. 325 + 137 විසැඳූ විටැ එනුයේ ද මේ 462 යන නම්වරය මැ සි. සොරොබානය හොඳට පුරුදු පුහුණු කළ කලැ ඉතා ඉක්මනින් නම්වර රැසක් වුව ද එකතු කැරුම ලෙහෙසි කරුණෙකි.

ජපනුන් අද ද වැඩට ගන්නා සොරො-බානයෙක් දෙ වැනි සටහනෙන් දැක්වෙයි. එහි ඉදි-පෙළ නවයෙකි එක් හරස් පෙළෙ-කින් මේ ඉදි පෙළ නවය දෙ කොටසකට බෙදෙයි. පහත කොටසේ දැක්වෙන ඉදි-පෙළ නවය දකුණේ සිටැ වමට සැලැකූ කලැ ඒ එක් එක් ඉදි-පෙළෙහි තැන්-අගය, එකු-පිල දසැ-පිල, සිය-පිල, දහසු-පිල යනු ලෙසිනි පිහිටා ඇත්තේ. ඉහළ කොටසේ ඉදි-පෙළ නවය දක්වන තැන්-අගය, පස-පිල, පනස් පිල, පන්සිය-පිල, පන්දහසු පිල ලෙසින් ගත යුතු යැ. දෙ වැනි සටහනෙහි සොරො-බානය දක්වන්නේ 162 යන නම්වරය සි. අප නම්වර සැටියට ඇත්තේ ඉලක්කම් සලකුණු දසයෙකි. 0, 1, 2, 3, 4, 5, 6, 7, 8, 9 යන ඒ සලකුණු වෙනුවට කළ හැකි සි. වෙසෙස් තිත් දසයක් යොදා ගත ද අපට පමණ වෙයි. මේ වෙසෙස් තිත, දිතිත (අදි + තිත=අදිතිත=දිතිත=Digit) සේ ගනිමු. අප නම්වර සැඩියට දිතිත දසයෙකි දිතිත දසයක් වූ පමණින් මැ නම්වර හැඳින්වීම කළ නොහැකි සි. එකු-පිල, සිය-පිල, දහසු පිල යනුවෙන් පිල් ගණනාවෙක් ද ඇවැසි වෙයි. සොරොබානයෙන් නම්වර හැඳින්විය හැකි බව අපි දුටුමු එ සේ නම්, සොරො-බානයෙහි ද දිතිත් හා පිල් හා විය යුතු සි. සොරොබානයෙහි දිතිත් නම් එහි ඇති පබළු යැ; පිල් නම් එහි ඇති පෙළ යැ. දිතිත් හා පිල් හා වහල් කැරැගෙනැ කිරිය කරන ගිණුම් යත් හැඳින්වෙනුයේ "දිතිත් සංගණන" යනුවෙනි (Digital Computers)

2

දූත් ලොව මවිත කරන "විද්‍යුරෝන් මනැස්" (Electronic Brains) ගණයට වැටෙන දිහිත් සංගණනයන්හි ආදි මෑ මූත්නා නම් අර සොරොබානය යි.

තමන් ගේ ගිණුම්-මිනුම් කරවාගන්නට මිනිසා යත් තනා - තම්මාගත් සැටි මින් පෑහැදිලි යි. එහෙත්, තම කටයුත්ත හැම-කක් මෑ පාහේ විදිලියට පවරන මේ අවදියේ විදිලියට සුදුසු සේ තමන් පෙළගැසුණු තැන් ද තැත්තේ මෑ නො වේ. විදිලියෙන් කිරිය කරන "විද්‍යුරෝන් සංගණනයට" (Electronic Computer) අප ගේ දස-පදනම් තැන්-ඇඟි නම්වර සැටිය නුහුරු යෑ. එ බැවින්, විද්‍යුරෝන් සංගණනයේ රිසි පරිදි, දෙ-පදනම් තැන්-ඇඟි නම්වර සැටියක් මිනිසා තනාගත්තේ යි. විදිලියෙහි සොබා හති දෙකෙකි. විදිලි පහනක් සලකා බලමු. පහන නිවී ඇති කලෑ වනුයේ එක් තතුවෙකි, දැල්වූ කලෑ ඇති වනුයේ අනෙක් තතුවයි. මේ දෙ-තතුව වහල් කැරගත් විටෑ හැදින්වියෑ හැක්කේ දිහිත් දෙකෙක් පමණි. දිහිත් දසයක් ඇති නම්වර සැටිය හැඳින්වියෑ නොහැකි නිසා දිහිත් දෙකක් ඇති නම්වර සැටියක් තැනුමට සිදු වියෑ. මේ දෙ-පදනම් තැන්-ඇඟි නම්වර සැටියට ඇත්තේ දිහිත් දෙකෙකි. 0, හා 1 හා යනු යෑ යි ගනිමු ඒ දිහිත් දෙක. එ විටෑ මේ දෙ-පදනම් තැන්-ඇඟි නම්වර සැටියෙන් එක; දෙක; හතර; අට; යන නම්වර හැඳින් වෙන්නේ 1; 10; 100; 1000 යනුවෙනි. අට යන නම්වරය හැඟැවීමට ඉලක්කම් සතරක් මෑ යෙදියෑ යුතු නම් දස-දහස වැනි නම්-වරයක් හැඟැවීමට ඉලක්කම් ගණනාවක් මෑ යොදන්නට වෙයි. එ මැනි නම්වර සැටියෙ-කින් වැඩ කැරුම අපට වෙහෙසකර වෙයි. එහෙත් අප යෑ ඉන් වැඩ ගන්නේ, තප්පර යකට මයිල 1, 86000 ක් දුවන විදිලිය නොවෑ ?



1 සටහන



2 සටහන

* * *

මුරකාරු සෙබලා.- හිටු, කවරෙක් ද ඔය යන්නේ! මිතුරා ද? සතුරා ද?

කාදවුරට පැමිණෙන සෙබලා:- මිතුරයි බෝතලෙයි

මුරකාරු සෙබලා:- මිතුරා ඇතුළු වනු, බෝතලය හිටු!

නේරුව

වි. ජ. මු. ලොකුබංඩාර

(දඹදිව නිදහස් සටනේ බැඳී හිර ගෙට ගිය නේරු එහි සිටැ සිය දූ ඉන්දිරා ගේ තෙළෙස් වැනි උපන් දිනෙහි ඇයට යැවූ පතිණයෙහි පෙරළිය යි.

ඔබ ගේ උපන් දිනයේ දී තෑගි බෝගත් සුබ පැතුමුත් ලැබුම ඔබට පුරුදු සිරිතෙකි ඈසිරි පැතුම් නම් ඔබට එමට ලැබෙනු ඇති එහෙත් මේ සිර ගෙදරැ සිටැ, මා ඔබට කවර තිළිණයක් දෙන්න ද? මා ගේ තිළිණ අතට අහු වන, නෙතට හමු වන, දෑ නම් වන්නට බෑ. පවනත්, මනසත්,. ඈතුළු හදවතත් එක් වැ නිමැවුණු තිළිණයක් මැ වන්නට ඕනැ. අර දෙව් ලොවේ, සුරඟනක ඔබට දෙනී සිනියැ හැකි, මේ සිපිරි ගෙහි උස් බිත්තිවලට වත් වලක්වන්නට බැරි ආරේ තිළිණයක් වියැ යුතු යි.

සුහද මිහිරිය, බණ දෙසන්නටත්, උපදෙස් දෙන්නටත් මා කෙතරම් අකැමැති ද යනු ඔබ දනිති. මෙ සේ කරන්නට සිතෙන සිතෙන විටැ, විටෙකැ මා පොතෙකැ තිබී කියැ වූ මහ පංඩිතයකු පිළිබඳ කතන්දරයක් මතක් වෙනවා. සමහර විටැ මේ කතන්දරය ඇති පොත දවසෙකැ ඔබටත් කියවන්නට ලැබේ වි මෙසින් සිය වසර තෙළෙසකට පෙරාතු වැ දැනුමත් නුවණත් ලබනුව චීන රටේ සිටැ දඹ දිවට පැමිණියා, රට - රටවලැ ඇවිද්ද තැනැත්තකු. හියුංසාන් නම් වූ මොහු උතුරේ කඳු වැටි පසු කැර, දුර කතර අතරක් නො තබා ගෙවාපියා, බියකුරු අතුරු අවහිර කම් මැඩැ-ලා පැමුණුණා. නුවණ කෙරේ ඔහු ගේ ඇල්ම එ තරම් මහත් වී

ඉගෙනැ - ගන්නා ගමත් අනුනටත් ඉගැන්නු මොහු, දඹදිවේ, වෙසෙසින් මැ දුන් පැවිනා නමින් හැඳින්වෙන පැළැලුප් නම් නුවර අසැ පිහිටි "නා ලන්ද" සරසවියේ, වසර ගණනක් ගෙවූවා. මහ වියතකු වූ "හියුං සාන්" "දහම්පති" යන පට ද ලබා, මුළු දඹ දිව් තලය පුරා ඇවිදිමින් ඒ ඉපැරැණි දවසේ එ රටැ වුසූ මිනිසුන් හමු වැ ඔවුන් පිළිබඳ හොඳ දැනුමක් ද ලැබුවා. පසු වැ, ඔහු සිය ගමන් තොරතුරු ඇතුළත් පොතක් කළා ඒ පොතේ යි, මට සිහිවන අර කතන්දරය ඇත්තේ. එය බිහාරයේ හගල පුරය අහලැ ඇති සවන රුවන -ස්වණ් කණ්- නම් නුවරට දකුණු දඹ දිව සිටැ ආ මිනිසකු ගැනැ යි. සිය බඩත්, ඉණත් අතරැ තඹ තහඩු පැළැඳි ඔහු, දල්වූ විදිලි පන්දමක් ද හිසින් ගෙනැ ගිය බව සඳහති. බර මුහුණෙකින් යුත් මෙතෙමේ මේ අරුම පුදුම ඇඳුමෙන් සැරැසී, අතින් තාඩියකුත් රැගෙනැ, බරට අඩි තබමින්, එහේ මෙහේ ඇවිද්දේ යි. එ බඳු කුහුල් ඇඳුමෙකින් සිටිනුයේ ඇයි දැයි කිසිවකු විමැසූ විටැ මොහු කීයේ සිය නුවණේ මහත් බව නිසා, බඩ පැළෙනී එ සේ තඹ තහඩු පළඳනා බව යැ ඔහු වටා සිටින අවිදු අඳුරේ ගිලුණු මෝඩයන් කෙරේ උපන් කුලුණින් හිසින් විදිලිය එළියක් රැගෙනැ යන බව් යැ.

හොඳයි, දැනුම වැඩි කමින් පිපිරෙනි යි බියක් මට ඇති හෙයින්, තඹ තහඩු යනාදි යෙන් සැරැසෙන්නට කිසිදු වුවමනාවෙක් නැ. කොහොමට වත්, මගේ දැනුම, මට තිබෙන දැනුම, නම් ඇත්තේ මගේ බඩේ නො වෙයි. එය - දැනුම – කොහි තුබුණත්, දැනුමට තැන් පත් වන්නට එහි තව ඕනැ තරම් ඉඩ කඩ ඇති හෙයින්, ඉඩ මඳ බවක් ගැන කිසි මැ කතාවකට ඉඩෙක් නැති.

මම, මෙ තරම් සීමා සහිත නුවණක් ඇත්තකු වෙමින් කෙ සේ නම් අනෙක් අයට ඔවා දෙම් ද? මා සඳ සිතූ, හරි කිමෙක් ද වැරැදි කිමෙක් ද කළ යුතු කිමෙක් ද නොකළ යුතු කිමෙක් ද යනු සොයා දැනැ ගැනුමට හොඳ මැ මග දේසනා කිරීමු නො වැ, කතා බහෙන් සැසැඳිලි කිරීම කියා යැ. සැසැඳිලි මගින් සැබැවෙන් බිඳෙක් හෝ එළියට එයි. මා ඔබ හා කතා බහ කිරීමෙන් සතුටු වූවා. අප බොහෝ දේ ගැනැ කතා බස් කළා සැසැඳිලි කළා ලොව පළල යි. අපේ ලොවින් එහාත් අරුම පුදුම ලෝ තලයන් තිබෙනවා. එහෙයින්, අප කිසිවකු අර හියුංසාන් සැඳැහූ මෝඩ උඩඟු පුහුලා

මෙන්, ලොවේ දත යුතු තාක් සියල්ල දනුම් යි සිතනු හොඳ නැහැ. එක් අතෙකින් සියල්ල දත්තකු නොවීම මැ මැනැවි. ඇයි? සියල්ල දත්තහුට, එ බත්දකු සිටනවා නම්, ඔහුට තවත් යමක් උගන්නට වර නැති දුක් සිතෙනු ඇති. අපට මහ සතුටට ඇති, නොදත් යමක් ඉගෙනීම, අලුත් දෙයක් සොයා දැනැ-ගැනීම නිසා ලැබෙන සොම්නස ඔහුට නො ලැබී යේ.

මා එ හෙයින් බණ දෙසියැ යුතු නො වෙයි. එහෙනම් මම කුම් කරම් ද? පහිණයක් කතා බහක තැන ගනු අසීරැයි. කො පමණ කලත් එය එක් පැත්තෙකින් පමණක් කැරෙන්නෙකි. ඉතින්, මා කියන බස්හි කිසි යම් අවවාදයක් වැන්නෙක් පෙනේ නම් එය අමාරුයෙන් ගිලියැ යුතු තිත්ත බෙහෙත් පෙත්තක් සේ නො ගන්නැ. සිතා-ගන්නැ, අප සැබැවට මැ කතා බහ කරමින් සිටිද්දී, මා ඔබට සිතා – මතා – ගන්නට යම් කිසි සැලැකැවීමත් කළා සේ.

එක් එක් රැගැ පිළිබඳ කතා පුවතේ රුවන් වන් යුගයන් ගැනැ ඔබ ගේ ඉතිහාස පත පොතේ සදහන් වී ඇති අපි උතුම් මිනිසුන් ගැනැ, උතුරු ඉතිරියන් ගැනැ, ඔවුන් කළ මහ ලොකු කැරුම් ගැනැ කියවමු. ලොවිතුරා සිහින ලොවේ දසුන් මඩලෙන් ඔබ්බට ගිය විටෙකැ, අපි ඒ යුගයන්හි ජීවත් වෙමින් එ දා ඒ මහ විරුවන් ඒ මහ විරැවියන් පෑ හපන් කම් දක්වන්නා සේ සිතින් මවා-ගනිමු "ජීන් ඩි ආර්ක්" නම් පොත පළමුයෙන් මැ කියවා අහවර කළ දා, ඔබ මත් මත් වූ තරම මතක ද? ඇය මෙන් නොමැකෙන යමක් කරන්නට ඔබ පැතූ සැටි කොහොම ද? නිකම් සුළු මිනිස්සුත්, සුළු ගැහැනුත් මහ විරුවෝ නොවෙති. තමන් ගේ එදිනෙද අහර වේල, දරු පැටවුන් පවුලේ කරදර කලබල යනාදිය ගැනැ යි, ඔවුන් සිතන්නේ. එහෙත් මුළු මහත් ජන රැසක් එක්තරා වෙසෙසි යමක් ගැනැ මහත් බැතියෙන් කටයුතු කරන්නට පටන් ගන්නා කාලයකුත් එනවා. අන්න එ විටැ නිකම් සුළු මිනිසුන් මහ විරුවන් වෙනවා. යටගියාව අලුත් වී, කාලාන්තරයකට අමතක කරන්නට බැරි තැනට පත් වෙනවා.

ඔබ උපන් අවුරුද්ද, 1919, දුක් විඳිනා දුගියන් කෙරේ මහත් කුලුණින් දයාවෙන් බර හදවතක් ඇති තමන් උපන් රැටේ මිනිසුන් ලවා ඉතිහාසයේ කිසි දාක අමතක කළ නොහැකි, කාලේ නොමැකෙන උතුම් පිරිසිඳියක් - පරිච්ඡේදයක් - ලියැවූ අවුරුද්-දක්. ඔබ මෙ ලෝ එළිය දුටු මාසයේ මැ තමා, ලෙනින්, රුසියාවේත්, සයිබීරියාවේත් මුහුණුවර වෙනස් කළ මහ විප්ලවය පටන් ගත්තේ. දුකින් පෙළෙන්නවුන් කෙරේ ඇති පරම කරුණා මහිමය නිසා, ඔවුනට අත් දෙන්නට ඇති අරුම පුදුම ඇල්ම නිසා, අද දඹ දිවැ ද තවත් මහ නායුවෙක්, අපේ මිනිසුන් පණ ගන්වා විරාගී කොටැ, ඔවුනට නිදහසේ රස දෙන්නට, සාගින්නෙන් දුකින් මැඬෙනා දුගී ගැති මිනිසුන් ගේ බැඳුම් ලිහන්නට, සැරැසී සිටියි බාපූජී, ගාන්දි, අද සිටින්නේ සිර ගෙදර. එහෙත් ඔහු ගේ නාමයේ පණිවිඩයේ රහස දඹදිව්යන් කෙළ ගණනක ගේ හදවත්හි නළියනවා. ලොකු මිනිසුන් ලොකු ගැහැනුන් මතු නො වැ, කුඩා කුමරුවන් පවා දඹ දිව නිදහස් කැර ගැනුමේ මහ සටනේ විරුමත් සෙබළුන් බවට පත් වෙනවා. අපි අද දඹ දිව ඉතිහාසය නිමවමින් සිටිමු. මෙ සේ ඇස් හමුයේ මැ සිදු වනු දක්නට තරම් පින්වත්, මේ මහ නළුයේ කොටසක් රඟන්නට තරම් පින් බර අපි වාසනාවත් වෙමු

මේ මහ සටනේ දී අපි කුමක් කළ යුත්තමෝ ද? අපි එහි කුමන කොටසක් රඟමෝ ද? මට කියන්නට බැහැ අපේ නඩේට කවර කොටසෙක් ලැබේ දැ යි. කිමෙක් හෝ වේ වා. අපේ සටනට නිහරසරයක් වන අපේ උදුර රැහැට අගරුවක් වන යමක් නම් අපෙන් සිදු නො වියැ යුතු බව සිහි තබා ගත යුතු යි. අප වෙත ඇති දඹ දිව පිළිබඳ මහත් හරසරය නිසා මහ විරුමත් සෙබළුන් වීමේ වරය අප වෙතැ මැ යි. කළ යුත්තේ කිමෙක් දැ යි අපට නිතර සැක ඇති වනු හැකි. හරි කිමෙක් ද වැරැදි කිමෙක් ද තීරණය කිරීම මහත් අසීරු කරුණෙක්. ඔබට එ වැනි සැකයක් ඇති වූ විටෙකැ කරන්නට පොඩි ගුරු කමක් කියන්නම්. එය ඔබේ උදවුවට සිටී වි. කිසි මැ දක කිසි මැ දැයක් රහසින් කරන්නට නම් එපා.

සැහැවීමට සිතෙන කිසිවක් කරන්නට එපා යමක් සඟවන රිස්සෙක් ඔබට පහළ වේ ද, ඒ නම් ඔබේ බියගුළු කම නිසයි. කුදිටු බිය වනාහි ඔබට ගැලැපෙන දෙයෙක් නො වේ. බිය නොවන්නැ. සියල්ල ඔබ පසු පසැ ඒ වි. ඔබ දිරිමත් නම් බිය නො වෙති එහෙයින් මැ විළි උපදනා කිසිවක් නො කෙරෙති බාපූජි මුල් වැ කරන අපේ නිදහස් සටනේ කිසි මැ කිසි දෙයක් සඟවන්නට රහසේ කරන්නට අවසරයක් නැති බව ඔබ දන්නවා. සැහැවියැ යුතු කිසිවක් අපට නැහැ අපි මහ අව්වේ එළියේ මැ කටයුතු කරමු. එ හෙයින් මැ අපි අප ගේ තැනැති දිවියේත් (පෞද්ගලික ජීවිතයේත්) මිතුරා - හිරු - හා මිතුරු වැ කිසි දෙයක් රහසින් හෝ හොරෙන් හෝ නො කරමු. තැනැති බව නම් අපට තිබෙන්නට මැ ඕනැ, එහෙත් එය රහසිගත බවට වඩා ඉඳුරා මැ වෙනස්. ඔබ එ ලෙසේ කරහොත්, මා පියෙ මිහිරිය, ඔබ බිය නැති, නිකෙලෙස් නිමල් ආලෝක දූරියක් වෙති.

මා කීවා, අද අප රටැ පමණ්නා නිද-හස් සටන දක්නට තරම් පින්වත් ඔබ වාසනාවත් බව එ මතු යැ? කිසිඳු බියක් නැති පොඩි ළඳක ගේ දුව වූ ඔබ ඒ නිසා, එයටත් වඩා වාසනාවත් ඔබ යම් මැ කිසි විටෙකැ, සැකයකට හෝ කරදරයකට හෝ බඳුන් වූ විටැ, ඇයට වඩා හොඳ මිතුරියක නම් ලැබෙනු නොහැකි යි.

ආසිබෝවත්, චූරි, දඹදිවට සේවා කිරීමට තරම් බුහුටි උතුම් සෙබළක වන්නැ. මගේ පෙමත් සුබ පැතුමුත් මේ සමඟ යි.

—නේරු

* * *

"මව් බස ලෙඩින් ද, නැත් නම් සුවයෙන් ද, එය නිතියෙන් මැනැවින් වැහැරැවේ ද යනු විමසා එයට සිත් යොමු කැරුම සුළු පටු කරුණෙක් නො වේ. ඇඳුම් පැළැඳුම් හෝ සිරිත් විරිත් හෝ සහමුලින් වෙනස් කැරුම දූයෙකැ මනසට නිමිත්තෙකැ යනු ප්ලේටෝ ගේ මතය සි. එහෙත් මම අනෙකක් අදහනු රිස්සෙමි බසෙහි නියම නිවැරැදි බව කෙලෙසෙත් මැ එ බස අයත් මිනිසුන් ගේ වැටීම ද ඔවුන් ගේ රජයේ පිරිහීම ද වනු නියති. වදන් මිල බාල කොටැ, ලාබ කොටැ, එහි රුවත් හනත් මකා හඳුනන්නට බැරි කල කලැ, එ වැනි වහරවන, කම්මැළි බැවින් පෙළුණු, කොන්ද පණ නැති, මිනිසුන් ගේ සිත් පිත් යම් බඳු වහල් බවකට මැ, පර ගැති බවකට මැ, පත් වන්නට කල් පැමිණී බව් මැනැවින් නොපැහැදිලි ද? එහෙත් තමන් ගේ බසෙහි නිවැරැදි බවත් මහා විලසත් රැකැ බලා ගන්නට ඇල්ම ඇති නෙක් කිසිම රටක් හෝ රජයක් හෝ මද එළියෙන් වත් නොබැබැළුණා නො ඇසූමු"

ඉංගිරිසි මහ කිවි

මිල්ටන්

පහදුව

බසෙහි වියරණෙහි ඔබට ගැටලු වැටෙන තැන් එළියෙහි පහදුව සඳහා ලියා එවුව මැනැවි. නමින්, නොනමින් හෝ පළ කළ හැකි යැ. පහතැ පෙනෙනුයේ එ බඳු ගැටලු කිහිපයෙක් ද එයට පහදු ද වෙයි.

1. ගල්කිස්සේ සාන්ත තොමෝසු විදුහලේ අක්බෝ ජයකුරුවෝ වියරණ පැන සතරක් අසති. එක් එක් පැනය යටසේ එළියේ පහදුව පළ වෙයි.

1. ඕ ගියා ය
ඕ ගියා
ඈ ගියා ය
ඈ ගියා

මින් නිවැරැදි කවරේ ද?

ඕ ගියා යැ, ඕ ගියා යන දෙක මැ නිවැරැදි යැ. මෙහි ගියා යනු පවතු (ආඛ්‍යාත) පදයෙක් නො වේ; කිරිය නමුවෙකි. (ක්‍රියා නාමයෙකි). ඒ පැවැසි පුරුව හෙවත් උක්ත පූරකය යි. පවතුව (ආඛ්‍යාතය) 'වෙයි' යනුයෙන් ඇදැගත යුතු වෙයි. එ කලැ ඕ ගියා යැ; ඕ ගියා යන්නෙහි අරුත ඕ ගිය තැනැත්තී වෙයි යනු යි. වැකි දෙක මැ නිවැරැදි වන්නේ මේ නිසයි.

ඈ ගියා යැ යන වැකිය වැරැදි යැ. යැ නිපාතය යෙදීම නිසයි. මේ වරද වූයේ යැ (ය) නිපාත යෙදෙනුයේ පවතු කිරිය (ආඛ්‍යාත ක්‍රියා), නමු කිරිය (නාම ක්‍රියා) ඇති වැකිවලැ අගැ මැ යි. ගියා යනු භව් නමු කිරිය (භාව නාම ක්‍රියා) පදයෙකි. ඒ මැ වැකියෙහි පවසු (උක්ත) යි. ඈ ගියා වෙයි කියා යි වැකිය සපිරෙන්නේ. ඈ ගිය බව වෙයි යන්න යි අරුත. එ හෙයින් නිවැරැදි නම් ඈ ගියා යන්න යි.

i ගේ ගියේ ය
 ගේ ගියේ } නමු කිරිය

ii ඔහු ගියා — භව් නමු කිරිය

iii ගේ යන්නේ ය
 ගේ යන්නේ
 ඕ යන්නී ය
 ඕ යන්නී } නමු කිරිය

iv ඔහු යනවා
 ඈ යනවා } භව් නමු කිරිය

මේ වැකි ද නිවැරැදි වන සේ සලකන්නැ.

2. වැකි අගැ නිපාතයක් වූ යැ (ය) භාව නාම ක්‍රියාව අගටත් යෙදෙනවා ද?

[නො යෙදේ ඒ යෙදෙන්නේ ආඛ්‍යාත ක්‍රියා (පවතු කිරිය), නාම ක්‍රියා (නමු කිරිය) දෙකින් අගැ බව මුලින් මැ පැහැදිලි කැරිණි.

i ආ. ක්‍රි. –
 ගේ පොත බැලී යැ.

ii නා. ක්‍රි
 ගේ පොත බැලුවේ යැ

iii භා. නා. ක්‍රි.
 ඔහු පොත බලනවා.
 ඔහු පොත බැලුවා.

මේ නිදසුනින් පැහැදිලි වැ වටහාගන්නැ යැ (ය) නිපාතය භාව නාම ක්‍රියා (භව් නමු කිරිය) අගැ නොයෙදෙන බව.]

3. බලන්නෙහි, බලන්නෙමි මේ කවර ක්‍රියා ද? හැදුණේ කෙසේ ද?

[නාම ක්‍රියා (නමු කිරිය) යැ හැදුණේ මෙ සේ යැ:

බලනු + ඒ = බලන්නේ
බලන්නේ + වෙහි = බලන්නෙහි
බලන්නේ + වෙමි = බලන්නෙමි

බලන්නෙහි යන්නෙහි අරුත බලන්නේ හෙවත් බලන තැනැත්තේ වෙහි යනු යි බලන්නෙමි යන්නෙහි අරුත බලන තැනැත්තේ වෙමි යනු යි.]

4. සිංහලයෙහි අනාගතය හඟවන වෙසෙසි ආඛ්‍යාතයෙක් නැද්ද? බලයි යන්නෙන් අනාගත රූපය බලන්නේ යැ ඈ විසින් ඉගැන්වීම හරි ද?

[සිංහලයෙහි අනාගතය හඟවන වෙසෙසි ආඛ්‍යාත රූපයෙක් නැති බලන්නේ යැ ඈ විසින් ලැබෙන්නේ නාම ක්‍රියාව මිසැ අනාගත ආඛ්‍යාතයෙක් නො වේ. ආඛ්‍යාත ක්‍රියා, නාම ක්‍රියා, භාව නාම ක්‍රියා තුනෙහි මැ වත්මන් කල් රූ අනා කල් ද හඟවයි.

ආ. ක්‍රි.

වක් - හේ දූත් පොත බලයි
අනා - හේ මතු පොත බලයි.

නා. ක්‍රි.

වක් - හේ දූත් පොත බලන්නේ යැ.
අනා - හේ මතු පොත බලන්නේ යැ.

හා. නා. ක්‍රි.

වක් - ඔහු දූත් පොත බලනවා
අනා - ඔහු මතු පොත බලනවා]

5. සකසුවාණෙනි, හෙළු බසෙහි ලුහුස් (ලිහිස්සීමෙහි) යන්න ගරසි (යවන) බසෙහි 'ලුසෝ' යැ යි ද ගැහැනි යනු ගානී යැ යි ද ලැබෙන්නා දිටිමි. අපේ වන්නිකරේ 'තොත්ත බබා' යැ යි කියැවෙන තන්හි එන තොත්ත යන්නෙක් ද ගරසි බසෙහි ලැබේ. හෙළ බසෙහි තොත්ත යන්නෙහි අරුත පහද දුන මැනැවි. — විමසු.

[විවසුවාණෙනි, තොත්ත යන්නෙහි අපේ අරුත ද 'කුඩා' (සිගිති) යන්න සි. තුතු = තොතු; තොතු + අ = තොත්ත. 'තුත්තිරි, තු තු කොට' ඈ තන්හිදු මේ තුතු පෙනෙයි. තුවි, සුවි, චූටි ඈ සැටියෙන් වූ වෙතස් කම් ද සලකන්නැ.]

6. 'කෙනෙක් එය කරන්නට ඇති.
කෙනකු එය කරන්නට ඇති'
මින් කිමෙක් ද නිවැරැදි?
- රංජනී මලලගම

කාසල් වීදියේ
බාලිකා පාසල.

['කෙනකු එය කරන්නට ඇති' යනු යැ නිවැරැදි. මේ මුළු එක මැ 'වෙයි' යන 'ආඛ්‍යාතයෙහි' උක්තය වෙයි. එ හෙයින් කෙනකු යනු අනුක්ත රුවින් මැ යැ තැබියැ යුතු.

මේ නියරින්

ඔහු එය කරන්නට ඇති
ඔවුන් එය කරන්නට ඇති
තා එය කරන්නට ඇති.
තොප එය කරන්නට ඇති
මා එය කරන්නට ඇති
අප එය කරන්නට ඇති.

යනු ද නිවැරැදි බව සලකන්නැ.]

7. සලාවත (හලාවත) යනු ලක් දිවෙ පෙර සිටැ පරසිදු තැනෙකි. මේ නමේ තේරුම කිම — ක. රූපසිංහ.

[සල් නම් වෙළෙඳ සල් (සාලා) යැ. වත නම් පාර සි; මාවත සි. සල් + වත = සලවත = සලාවත (සත් + අසු = සතසු = සතාසු වූ සේ යැ) සාප්පු කඩ වීදිය යනු යැ සලාවත යන්නෙහි සැමැති අරුත]

8. බත පිළුන් වුණා, පිළුන් කෑම වැනි තන්හි එන පිළුන් යන්නෙකි නිසැදියාව දක්වන්නැ — ක. රූ.

[පුරුණු = පුළුණු = පිළුණු; බත පිළුණු වුණා යන්නෙහි අරුත බත පරණ වුණා යන්න සි. පිළුණු කෑම නම් පරණ හෙවත් යල් පැනැපු අහර සි.]

9. නැත, නැති. - මෙහි වෙනස කිම? — ක. රූ.

[නැත නම් නැතහොත් යන්න සි, නැති නම් නැහැ යන්න සි. 'ගුණ නැණැ'ත ඇති නැත නැති' — කියවන නුවණ. ගුණ නැණ ඇතහොත් තිබෙයි. නැතහොත් නො තිබෙයි යන්න සි එහි අරුත.

10. තිළිණ - තිළින
පිළිණ - පිළින
නිවැරැදි කවර පද ද? - ක. රූ.

[තෑගි අරුත්හි තිළිණ යනුත් ප්‍රතිඥ අරුත්හි පිළින යනුත් නිවැරැදි වෙයි.]

11. කිරි හළ ද; කිරි හල ද?
සුනන්ද ජයවර්ධන.

හළ යන්න එනුයේ හර හැරීමෙහි කිරිය මුලිනි. හළ නම් ඉවත් කළ යන්න සි. එ බැවින් කිරි නැති තැනකට නම් කිරි හළ යනු නොබී. කිරි හල යනු යැ යෙදිය යුතු.

12. වෙළඳ පොළ ද; වෙළෙඳ පොළ ද? - සු. ජ.

[වෙළෙඳ යනු යැ වදනේ මුල. වෙළඳ යනු වැරදි සි. හරි නම්, වෙළෙන්ද, නො වැ වෙළන්ද, වියැ යුතු නො!]

13. අනික් ද, අනෙක් ද? - සු. ජ.

['අන්' යන්නට 'එක්' යන්න ඈඳුණු විටැ එනුයේ අන් + එක් = අනෙක් යනු සි අනික් යනු වැරුදි යැ.]

14. උවමනා ද; වුවමනා ද? - සු. ජ.

[වූණහොත් මනා වනුයේ යමෙක් ද ඒ වුවමනා වෙයි. එසේ මැ යැ යෙදියැ යුතු වදන තැනුණු සැටි ද පෙනෙන ලෙසින්]

15 පිළි නොගනී ද; නො පිළි ගනී ද? - සු ජ.

[පිළි යන්න පෙරළකරුවෙකි (උපසර්ග-යෙකි.) එය ගනී යන්නට ඈඳූ කලැ එනුයේ පිළිගනී යනු යි. එයට 'නො' යන හෙළිය ඇඳියැ යුතු පිළිගනී යන වදනට පෙරින් යැ. එ බැවින් නිවැරැදි නො පිළිගනී යන්න යි]

16. බෞද්ධ යන අරුත්හි බොදු යැ යි හෙළ වදනක් තිබියැ දී ඒ අරුතට මැ බුදුනු යැ යි නව වදනක් තනා වැඩ ගැනීමේ අමුතු යහපත කිමෙක් දැ යි යහළුවෙක් මගෙන් අසයි. මේ ගැනැ ඔබ ගේ අදහස කිම?- අනඳපිය කුඩාහිමි, කොළොඹැ යුද හමුදා කාරියාලයයේ දී යැ.

[i. බොදු යනු බෞද්ධ යන්නෙන් බිඳැ-ගැනුණෙකි.

ii. බුදුනු යනු හෙළ බසින් මැ තැනුණෙකි.

iii. බොදු යන්න බිඳැ ගැනුණු නියාව නොපැහැදිලි යැ. ඒ අනුවැ ජෛන, ශෛව, වෛෂ්ණව ඈ හෙළ බසට බිඳැගත්තා නියා-ව ද නොපැහැදිලි යැ.

iv. බුදුනු යනු තැනුණු නියාව පැහැ-දිලි යැ. බුදු + අනු = බුදුනු; ඒ අනුවැ ජෛන, ශෛව, වෛෂ්ණව ඈ හෙළ බසින් මැ තැනීමේ නියර ද පැහැදිලි වෙයි.

ජින + අනු = ජිනනු
සිව + අනු = සිවනු
{විස්නු + අනු = විස්නුනු
{වෙන් + අනු = වෙනුනු
බඹ + අනු = බඹනු
හිරු + අනු = හිරුනු
කිතු + අනු = කිතුනු
කුංපුව්සි + අනු = කුංපුව්සිනු
සරාතුස්ත + අනු = සරාතුස්තනු
මහම්මත් + අනු = මහම්මතුනු (Marxist)

v. බොදු යන්නට වඩා බුදුනු යන්න නැමියාවෙන් ද වැඩිතර වෙයි.

බුදුනුවා, බුදුනුවිය
බුදුනුව
බුදුනුවාව·
ඈ හුදු නමුත් නව සමස්, නම්දුනු (තද්ධිත) ඈ නමුත්,

බුදුනුයයි (බුදු + අනුයයි), බුදුනුයති ඈ විසින් වර තැනෙන හුදු කිරිය වැලත්, නව පියෙදු, ඈංසි, විදි කිරිය වැලත්, නමු කිරිය හව් නමු (භාව නාම) කිරිය, නිපා (නිපාත) කිරිය ඈත් ගැණැ බලන්නැ.

බසෙහි වැඩට ගැන්ම අතින් බොදු යන්නට වඩා බුදුනු යන්න මැ නිසිතර බව එ විටැ ඔබට මැ වැටැහෙනු ඇති.]

6. අම්බලම්ගොඩැ දහම්සෝ විදුහලේ උපාලි ද සිල්වා, කඩුලු පන්දු කෙළියෙහි යෙදෙන ඉංගිරිසි වදන්වලට නිසි හෙළ වදන් පතති. හෙළ වදන හා ඉංගිරිසි වදන හා දෙක මැ පහතැ දක්වේ

පිල - team
පිති දරුවා }
පිති දරන්නා } batsman
මුල් පිති දරු යුවළ - opening pair
වරය - turn
කඩුලු - wickets
කඩුලු රකුවා }
කඩුලු රකින්නා } wicket keeper
පෙඳයුවා - bowler
පෙඳැයෙනවා - he is bowled
පෙඳැයුණා - he was bowled
සහකෙළුවෝ - members of the team
පිල්නා - captain
අල්ලුව - catch
තුඩු අල්ලුව - tip catch
පිටිය රැක්ම - fielding
ඉම්ය - boundary or four
ඉම් වැළැක්ම - stopping of boundaries or fours
ඉන්ම - innings
තණ තිල්ල - turf pitch
පැදුරු තිල්ල - matting pitch
අත් කොපු - gloves
පා කොපු - boots
පා බැති - wellingtons
දණ රකු - pads
විනිසුරු - umpire

කයිපය - L. B. W.
(කඩුල්ල ඉදිරියෙහි පය =
ක. ඉ. ප = කයිප
දූවෙනවා - he is out (Lit, cut out) දූ
කැපීමෙහි 'ධාතු' යි.
සැයිය - sixer

18. ගිනවත් සකසුවාණෙනි,

දෙටු විබෙදුවට නියම 'නවීන පද්‍ය රචනායෙහි' ර. තෙන්නකෝනුන් ගේ 'නම්මැත්තා සොහොනෙහි' පහතැ පෙනෙන කවි අපට ගැට මුසු සේ පෙනෙයි. එහි අරුත් කුලුණින් පහද දුන මැනැවි.

1. පැදිය - සක්වල කියන......
2. ,, - සැබැවින් ජානකී හරණය....
8. ,, - සැරැසුමැ අසුන්......
16. ,, - පෙවූ තන මැ......

(G) හිනියගල

හාල්ගරනඹයේ
සැරියුත් අරම.

මෙහි අරුත්, වවුලුවට ජයන්ත වීරසේකර සූරින් කළ විවරුව බලා දත හැකි යැ. එහෙත් ඔබට වැඩ පතා සැකෙවි අරුත් පළ කෙරෙමු.

සක්වල කියන.....

පෙළ ගැස්ම:- කම් (කර්මය) ඉඩ වැඩුයේ (වඩා දුන්නේ) නම්, සක්වල කියන (නමැති) මෙ මහ රුකඩ මඩුයේ නූල් කොන්, ලඳ (ගැහැනිය ගේ) මොළ පිඩුයේ (මොළය නමැති පුඩුයෙහි - ගැට එක්වන තන්හි) එක් (එකතු) වී ඇතැ යි දක්වන (දක්වතොත්) සමත් වන (සමර්ථ වන්නාවූ) නෙක් (බොහෝ) වෙහෙර මහ දේවියො (දේවීවරු) තෙල (ඔය) කඩුයේ (කැලැයෙහි) වෙති.

පහදුව - ඉඩක් ලැබුණා නම් මුළු සක්වළ මැ එක් රුකඩ මඩුවක් කොටැ නැටැවීමෙහි සමත් සුර නුවණැති විහාරමහා දේවිවරු ඔය කැලෑවේ සැතැපෙති.

සක්වළ රුකඩ මඩුවෙක් නම් එහි දනෝ රුකඩ වෙති. ඔවුන් නටවන නූල් කොන් එක් වන පුඩුව නමා ගැහැනිය ගේ මොළය. ඉඩ වැඩීපුර ලැබූ හෙයින් වෙහෙර මහ දේවිය එ බව පළ කළා යැ. එහෙත් එ වැනි ඉඩක් නොලත් හෙයින් මෙහි සැතැපෙන වෙහෙර දේවිවරු නිකම් මැ සැතැපෙති.

සැබැවින් ජානකී හරණය

පෙළ ගැස්ම:- සැබැවින් ජානකී හරණය (සීතාව පැහැරගැන්ම) එයට නිසි රවුලා (රාවණයා) කළ සැටි මැ සරි වේ දූයි, දන (ජනයා) සී (සීතා සී) සී සී (ඡී ඡී) යෙති (කියති) යි ඒ (ඒ ජානකී හරණය නම් පොත) කැරුම් රිසි හල (අත් හළ) සේ (ලෙස) කුමරදස් කිවියෝ මෙහි පසින් වැසි වෙති.

පහදුව - අපේ කුමරදස් කිවියෝ ජානකී හරණය නම් කව කළ හ. එහෙත් නම්මැත්තා සොහොනේ හොවින. සෙසු කුමර දස් නමැත්තෝ එය නො කැරැ මැ හොවිති. ඇයි? ජානකී හරණය (සීතා පැහැරැ ගැන්ම) කරතොත් එයට එක මැ නිස්සා රාවණයා මැ බව දත් ලෝ දනන් සීතා සී, සී සී යැ යි කියන නිසා යැ.

සැරැසුමැ අසුන්

පෙළ ගැස්ම - අසුන් සැරැසුමැ (අස්වයන් සැරැසීමෙහි ලා) නාසේ ලැම (නාහේ විදීම) නොසිරිතැ (නොසිරිතෙකැ යි) යනු හිස ගියත් (ඔළුව නැති වුණත්) පැවිදියනට හැගැවිම නො මැ හැකි යි දූකැ අත්තනගලු යැම හළ (අත් හැරිය), මෙහි සැතැපීම ලද, සඟබෝවරු යැ වැඩි.

පහදුව - පඩු අබාවන් ලවා පැවිද්දේ වෙළඹකට නාහේ දම්මූ හ. අසුනට එ සේ නාසේ ලැම හිස ගියත් පැවිද්දකට ඇගැවීම බැරි දෙයෙකි. එ බව් දත්, අත්තනගලු යැම අත්හළ සිරිසඟබෝවරු යැ මෙහි වැඩි පුරැ මැ හොවික්තෝ නම්.

පෙවූ කිරි තන මැ...

පෙළ ගැස්ම - හෙළ පඩු අබා රද (රදුට) කිරි පෙවූ තන මැ (චිත්‍රාව ගේ පියොවුරු මැ; ඕ ද මේ සොහොනෙහි මැ නිදති). [ලැබ], ඔහු (ඒ පඩු අබා රදු) ඇඟ දෙවූ (සේදූ) වැව මැ (අබය වැව මැ) ලැබැ, ඔද වැඩුණු තෙල (අර) රුක්හි දෙවූ (හට ගැන්වූ) පල වැල රස විඳැ ද අපන් (සිංහල) නුවූ කලැ සිංහල වූවෙක් කො ද (කොයින් ද?)

පහදුව - මේ ගස පඩු අබා මහ සිංහලයා කිරි පු තන මැ ලබා, එ රජු ඇඟ දෙවූ වැවේ දිය මැ ලබා වැඩුණේ යැ. එ බඳු රුක්හි පල වැල කන අපන් සිංහල නො වේ නම් සිංහල වූයේ කවරෙක් ද?

සමනල පාලම

අනඳපිය කුඩාතිගී

රඳවන සවනේ 'හෝ හෝ නානම'
රළ පෙළ බිඳෙන නදින් හැම වේලේ ම
සසුර'සැ පිනවන දන මන නැරැ ම
ගාලු පුරේ වෙයි සමනල පාලම

'හැඩුලොක් පියෙසින්' එන ඇළ මුහුදට
ගලා බසිනු නුදුරිනි මල් උයනට
එහි සිරි නරඹන්නන් ගේ සතුටට
හෙය අයුරු යැ සමනල හෙය මොනොවට

ඇළ දූලේ අඹ වටයෙකැ හැඩයට
දෙ පියාපත් සේ විදුහු දෙ පසට
සුසැදුණු සමනලයකු බඳ විලසට
පාලම මැද යළි යොමු වෙයි පහළට

දුවයෙනි පාලම තනා තිබෙන්නේ
එ මගිනි දන මල් උයනට යන්නේ
බෙහෙවින් මෙ පුරෙහි සිරිය දිලෙන්නේ
සමනල පාලම නිසා යැ දන්නේ

පාලම අසැ ගල් පර මතැ සිටැගෙන
බිළී බාති ඇතැමෙක් එහි ලොල් වන
පැටියන් සවසට මෙ තැනැ මැ දුවැටෙන
නෙත් යොත්තෙන් බානං වැනි මෙ දසුන

එහි සිටැ වට පිට නරඹන උන් ඇස
දිවැ යෙයි ලන්දෙසි කොටුවට පෙර පස
දිසි වෙයි ඇතින් නැව් තොටුපළ යස
නාන තොටට ද ඇසැ'දෙසි එහි පැළ පස

ඇළ දූලේ ඇති වැටකේ පඳුරින්
සුවඳ පවන උයනේ මල් අතරින්
දුවැටෙයි පෙම්වතුනැ'හැ වැදූ අදරින්
සුවඳ කොහි ද වැඹි?' විමසන අයුරින්

'මල් ගොමු අතරේ සුළඟට ලෙළ දෙන
නන් පැහැ සමනලයෝ වෙති රඟ දෙන
දුරියන් කෙළි ලොල් පාලම මතැ වන
සමනල නැයන් වැනි යැ යි පවසන

පාලම සුපිහිටි ඇළ දෙ පසේ ඇති
අරලිය තුරුවලැ සුදු රතු මල් ඉති
දුරියන් වරලස ඇමිණෙනු වී රැති
නව නව පෙනෙනුම මෙන් උස් වී ඇති

ගාලු කොටුව සහ සමනල පාලම
අතරේ 'පොල් ගිති බැද්දැ'සි පළ බිම
පෙම්වතුනට හුරු රසවත් මිහිනුම
පාරාදිසයෙකි මෙ අවටැ ගත් නම

ලොව්තුරු සුව

චන්ද්‍රා ආශුබෝධ

අහඹුයෙන් මැ යි ඈ
මං නෙතට ලක් වූයේ
අහා! ලස්සන පැහැ පත්
සියුමැලි රතු රෝස මල

ඈගෙ ඉම්හිරි සුවඳ
නව නවත් මං ඈ වෙත
ඇදුගති; නෙළාගන්නට
සිත් වුණා; එ නමුත් මම
දනිමි පසු වැ වන හදිය

රැවින් මගේ නෙත්
නහවාගත්තා
සුවඳින් ම-නැහැය
පිනවාගත්තා
ඒ හැම මනසේ
රඳවාගත්තා

අවසර ඇති විටෙක
ඒ සිහි කරන මං අද
හා! විඳින ලොව්තුරු සුව!

* * *

'නුවණ නුවන දී
විමසන නිබැඳී
හැම රට අගැ දී
හෙළයට පරදී'

— හෙළ මියැසිග

හෙළ ගැදි ආර

දි. වි. රිචඩ් සිල්වා

වැඩුණු ගැදි ආරෙක් හෙළ බසට ඇත්තේ යැ. පැරැණි පොතින් ද සීගිරි ලියැවිල්ලෙන් ද පෙනෙන කරුණෙකි ඒ. ගුරුළු දමියන් ගේ,

1. 'මම මර දෙව් පින්මි.'
2. 'සත් රුවන් පාළ වෙයි.'
3. 'මහ බෝ සතාණෝ නිදන්නට වත් හ.'

වැනි යෙදුමෙන් ද, සීගිරියේ

1. 'මහමෙත්මි ලීමි.'
2. 'මෙ කසබල ගී.'
3. 'සිහිගිරියට ගී' වැනි යෙදුමෙන් ද පෙනෙන්නේ, දියුණු හෙළ ගැදි ආරක් පැවැති බව යි. ඉතා කෙටි වැකි, ඔදවත් වැ පණවත් වැ ලියැවුණු සැටි, සිත් අදී. වත්මන් ගැදි ආරට ඉන් ගත හැකි වැඩ බොහෝ යි.

හෙළ ගැදි ආර කෙමෙන් කෙමෙන් පිරිහිණි. හෙළයා ගේ පිරිහීම හෙළ ගැදි ආරේ යටගියායෙන් ද පළ වේ. මහනුවර - මාතර අවදියේ දී ඉතා මැ පිරිහුණු ගැදි ආර ඇසුරිනි, පත් බස (Journalese) පහළ වුණේ. පුවත් පත පැවැත්වීම වෙළෙඳ කටයුත්තක් හෙයින් එහි පිවිසුණු, පිරිහුණු ගැදි ආර, තවත් පිරිහුණු බව අමුතුයෙන් කියැ යුතු නො වේ. පැරැණි පුවත් පතින් තහවුරු කැරෙන්නෙකි. එ කරුණ. නුවණ ඇස නොපැදුණු අවදියෙකැ බිහි වුණු පත් බසින්, වත්මන් ගැදි ආර පහළ විණැ යි කියන බොළඳෝ ද වෙති. ඉතා මැ දියුණු ගැදි ආරක් හෙළයාට ඇති බව ඔවුනට නොවැටැ-හෙන්නේ, සරසවි පටෙකින් වත් ලැබෙන හෙළ බස් දැනුමක් වත් නොවන නිසා යි. සමහර පුවත් පත් ලියන්නන්, බඩ වැඩීමට යෙදූ පත් බසින් වත්මන් ගැදි ආර පහළ විණැ යි කෙනෙක් කියති. පත් බසේ පහත් බව ඔවුනට නොපෙනෙන්නේ, නොවැටැහෙන නිසා මුත් නො වැ, බඩ වැඩුම මැ සලකන නිසා යි.

මහනුවර-මාතර අවදියේ උගතුන් ගේ ගැදි ආර පිරිහුණේ නොදැනුම පතළ වීමෙනි දත් නතු සැම අතින් මැ වෙතස් සැ. හෙළ ගැදි ආර ද හෙළි කරන්නට උගත්තු පහළ වූ හ. රත්මලානේ සිරි දම්රම් තා හිමි, බටුවිටැ අබාගුණරුවන්, මාසල මුදලි ගුණවඩු වැනි වියතුන් ගේ පබඳින් පෙනෙන්නේ, පත් බස් නො තකා හෙළ ගැදි ආර පිහිටුවා පබඳින්නට ගැනුණු තැන යි. ඒ වියතුන් ගේ පබඳට දෑ අද රට පඩුවන් කියන කිසුම් ඇසෙන විටැ, සරසවිය දත් අදිපති කම් කරන්නේ දැනුමට නොවන බව පැහැදිලි වේ.

මහනුවර-මාතර අවදියේ දී වියරණය මරා බොහෝ දෙන ලීසුයේ දැනුම ලබන මං නොතිබුණු නිසා යි. පර සතුරු උවදුරින් රට පෙළුණු අවදියේ දී, හෙළ බස හෝ වියරණය හෝ ගැනැ පිරිපුන් දැනුමෙක් නො විණි. එහෙත් දැන්? හෙළ බසත් වියරණයත් පැදුණු අවදියෙකැ වෙසෙමින්, ගැදි ආර කෙලෙසමින් ඇතැමුන් ලියන ලියැවිල්ලෙන් වන විපත බිහිසුණු යැ. පර බසින් ලියන විටැ, පර බස් දන්නකු ලවා සිය ලියැවිලි නිවැරැදි කරවන ඔවුන්, සිය බසින් ලියන විටැ ගැදි ආර කෙලෙසන්නේ වියරණය මරා යි. වෙන කුමක් දත ද ඉන් සිය සිය බස් වියරණ දැනුම නොලැබෙන බව ඔවුන් නොදන්නේ නොදැනුම නිසා යි. සරසවි ඇදුරු කම් ලබා සිය බසින් කටයුතු කරන ඇතැමුන් ගේ යෙදුම් ගැ මේ.

"ජානකි හරණය කෙළේ කුමාර දාස-යන් ය."

'කිවියයන් පසිත් වැසී සිටිති.'

සිය බස ගැනැ සරසවි ඇදුරු කම් ලබන්නට පළමු, ඔවුන් කළ යුත්තේ සිය බස් දැනුම ලැබීම නො වේ ද? එහෙත් නොවාසනායෙකැ මහත! දැන් තැන් ලැබෙන්නේ දැනුමට නො වැ නොදැනුමට නො?

සරසවි පුවසුරු කම් කරන්නකු ගේ යෙදුමෙකි, 'ඔහුට භාර්යාව වශයෙන් සිටියේ වර්ජිනියා වුල්ෆ් මැනිනිය යි' යනු. මේ වැකියෙන් කියැවෙන්නේ ලෙනාඩ් වුල්ෆයනට බිරියක නුවූ බවත් වර්ජිනියා වුල්ෆ නැමැත්තිය බිරිය ලෙස වුසූ බවත් යැ. බිරිය ගේත් බිරිය ලෙස වෙසෙන්න ගේත් වෙනස නොදන්නවුනට පුවසුරු කම් ලැබෙතොත් මේ අසිරිමත් රටේ යැ. 'භාර්යාව වශයෙන් සිටියේ' යන්නෙන් දැක්වෙනුයේ ගැහැනියක නො වැ පිරිමියකු බිරිය ලෙස වුසූ බව යි. ඉන් කියැවෙන්නේ, යවන පෙම 'ගැනැ

නො වේ ද? පුවසුරු කම් ලැබීමට නම් එ බඳු කුණු සරුප ලිවියැ යුතු යැ! ලෙනාද වුල්පයෙනි, ඔබ ගේ නම කෙලෙසූ පුවසුරුවනට විරුදු වැ ඔබ නඩු නොපවරන්නේ ඇයි?

සරසවි පුද ලද නව එකකු ගේ වැකියෙකි මේ. 'මැඩියා වනාහි නයාත් ගැරඬියාත් හැර වෙන එක ද සතකු නොකන තරමේ ජීවයෙකි' මැඩියාත් නයාත් ගැරඬියාත් නොහඳුනන්නකු ඒ වැකිය කියවා ලබන අරුත කිමෙක් ද? මැඩියාට නයාත් ගැරඬියාත් ගොදුරු වන බව යි ඒ. එ බඳු ලියැවිලි ලියන්නවුනට යැ සැලැකිලි!

1. 'කලිසමට උඩින් ඇඳි රෙද්ද, දෙ දණ තෙක් වැටෙන කබාය, ටයි, මේස්, සපත්තු ඔහුට අමුතු විකට වෙසක් දුන් ඇඳුම් පැළඳුම් වී ය.'

2. 'අනික් පැත්තේ බිත්තියේ එල්ලී සිටි අක්කාගේත් ඇගේ සැමියාගේත් මඟුල් පින්තූරය...............'

3. 'දවසක ගස් උගුළුවා බිම හෙළන තරම් සුළඟක් හැමීය.'

4. 'උදළු මිදුලෙහි තබා ගෙට ගොඩ වුණු ඔවුන්ට උදළු අහක තබා වාඩිවෙන්නය යි කීවෙමි.'

5. 'අම්මා සංවේගයෙන් තාත්තා දෙස බැලුවා ය. හිසට නැඟුණු කෝපය ඇති තාත්තාත් අම්මා දෙස බැලුවා ය.'

ඒ තැන් දක්වුණේ වත්මන් ගැදි ආරක් ඇරැඹිම ගැන ඇතැමුන් ගෙන් පුද ලබන 'මාටින් වික්‍රමසිංහ' සූරීන් ගේ විරාගය නම් පොතිනි. නිදසුන් කිහිපයෙකි පැයේ. ඔවුන් ගේ පොතෙහි එ බඳු යෙදුම් ඉතා බහුල යි. ඔවුන් සරසවි වරමින් පිදීම් එ තෙක් පමා කිරීම මහ පව් කමෙකි.

හෙළ වියරණය මතු නො වැ, හෙළ වහර ද මරා ලියැවෙන ගැදියෙන්, දුන් අඩුවෙක් නැති. ඉංගිරිසි මහිමය පාමින් සිංගිරිසි යෙදුමෙන් හෙළ ගැදිය කෙලෙසන්නෝ යැ සරසවි පට පුහුවෝ ද ඔවුන් ගේ ගුරුහු ද.

1. 'වැල්ල වෙත පැමිණී ඇ'

2. 'මා පිළිබඳ සිතක් ඇ තුළ ඇති. නම්'

3. 'බොනට් එකට නැග්ගෙමි.'

4. කළුගත් පොට්ටනියක් වැල්ල මත තැබූ ඇ'

සිංගිරිසි 'මහාවාරිගත්' ගේ අනුදනුම ඇති වැ නීල කැරෙන 'ජීවන සුවඳ' නම් පොතින් ගැනුණු කිහිප තැනෙකි ඒ. හෙළයා යන්නේ වැල්ලට යැ. සිංගිරිසියා යන්නේ 'වැල්ල වෙත' යැ. හෙළයා කළය තබන්නේ වැල්ලේ යැ. සිංගිරිසියා කළය තබන්නේ 'වැල්ල මත' යැ. හෙළ වියරණය පසෙක තිබියේ වා. හෙළ ගැදි උරුව වත් සිංගිරිසියෝ නො දනිති. ඔවුනට යැ සරසවි ඉඩ, සරසවි වරම්!

හෙළ බස නොදන්නවුන් පොත් ලිවීම නිසා වත්මන් ගැදි ආරට විපත් පැමිණේ. රට හිංගල ඉගෙනැ පර බස් මහිමය පාන්නවුනට පිළිවත් හෙළ බසක් නැති හෙයින්, හෙළ ගැදි ආර ඔවුන් ගෙන් කෙලෙසේ. කිසි මැ වියරණයකට නැති ඔවුන් යොදන හඩු ගැදි ආර බලා ඇසියැ යුත්තෙකි. පුරංසුයේ හෝ ඉංගිරිසියේ හෝ කුලවත් පොත්, ගැදි ආර වියරණ මැරුමෙන් කෙලෙසී ඇත් ද? හෙළ බස බැරි නම් ඒ නො ඉගෙනැ ඔවුන් කරන විහිළුව කිමෙක් ද? පෙළ සකුව වැනි බස් කරට ගැනීමෙන් එ ද, හෙළ ගැදි ආර පිරිහුණු සේ, ඉංගිරිසිය වැනි බස් කරට ගැනීමෙන් මෙ ද හෙළ ගැදි ආර ද පිරිහේ. වළකන තැනෙක් දුන් මැ වුවමනා යි.

ඉතා හොඳින් වැඩී පැවැති හෙළ ගැදි ආර, නොමනක කරන්නට තැත් කළ ද සඳහට මැ ඇස්හි අළු ගැසියැ නොහැකි බව මතක් කළ යුතු යි.

වෙලෙඳුන් විසින් හෙළ ගැදි ආරට විපත් පැමිණෑවුණ ද, ඇතැම් වියතුන් නිසා ඔවුනට ඒ නොකළ හැකි යි. කුමරතුඟු මුනිදසුන් ගේ පබඳෙකින් වත්මන් ගැදි ආරට ලද හැකි හොඳ නිදසුනෙකි මේ.

'ඒ කිමෙක් ද? මෙ ලොව නො වේ. එ ලොවත් නො වේ. දෙක අතරෙහි එකක් වියැ යුතු යි. ඔව්, ඔව්, ඒ තමා මැද ලොව. මම දිනක් එහි ගියෙමි. බෙහෙවින් එහි යන්නෝ එ ලොවැ මැ යෙති.'

හෙළ ගැදි ආර රකිනු කැමැත්තන් ගේ සැලැකිල්ලට ලක් වියැ යුත්තෙකි, මෙහි මුලින් මැ පෑ නිදසුන්. මේ නව යුගයට ඉන් ගත හැකි වැඩ අපමණී 'සීගිරියට ගී' යනු දුන් වෙසෙන 'ලේ - බකයකු' විසින් ලියැවිණි නම්, 'සීගිරිය සඳහා මා විසින් ලියන ලද ගී ය මේ' යනුයෙන් ලියැවෙන්නේ කෙටි බව, ඔදවත් බව යන ඇ සියලු ගුණ නසා යි. මුළු අදහස මැ දෙ පදයෙකින් දුන් සැටි සැලැකිල්ලට ලක් වියැ යුත්තේ යැ.

'පාරිභාෂික' පටලැවිල්ල

රජයේ බස සිංහලය වූ ද සිටැ සිංහල සිප් වදන් වෙනුවට, කිසි බසකට අයත් නැති, කිසි වැඩකට ගත නොහැකි, "පාරි-භාෂික ශබ්ද" යන්නෙක් සිංහලයා මතැ පැටැවෙන්නේ යි. "පාරිභාෂාව" රකින්නට සමහරුන් පුවත් - පත් තීරු ගණන් තැසුව ද "පාරිභාෂාවෙන්" වැඩ කරන්නට තත-නන්නෝ අවුලෙන් අවුලට මැ වැටුණෝ යි.

තමන් හට ඇවැසි සිප් වදන් තනා-ගැන්මට පැරැණි සිංහලයා හට හෙළ බස මැ පමණ වූ සැටි, බුරුමය තොරපතය, යත්ත කියත, සොරොව්ව, දියකඩිත්ත, ඈ දහස් ගණන් වදන් දෙස් දෙයි. එහෙත්, මෙ ද පඬුවන් සේ පෙනී සිටින්නෝ ඒ කටයුත්තට හින්දි, දෙමළ, සකු, මගද, ඈ පර බස් වහල මැ පතත්. උනට නිසි පිළිතුරු සැපැයීමට මෙන් ලේ රජයේ විදිලි අදිකාරියත්, ලංකා මිනිතෙල් මඬුල්ලත් සුදුසු හෙළ සිප් වදන් තනා වැඩට ගත් හ. ඒ හෙළ සිප් වදන් හැකි පමණින් රටට දෙන්නට ගත් තැනෙකි මේ.

"පාරිභාෂික ශබ්ද" හා සසඳ බැලූ කලැ, හෙළ සිප් වදන් කො තරම් අගනේ දැ යි පැහැදිලි වෙයි. මේ හෙළ සිප් වදන් බොහොවෙකැ අරුත එහි මැ ගප් වැ ඇති. ඉඳුරා නොවැටැහෙන වදනෙක් වේ නම් සකසුවන් විමැසුවහොත් එන කලඹින් පිළිතුරු සැපැයේ. පහතැ පළ වනුයේ රේදෙව් සැළකුරු (Radio Communication) සිප් වදන් සම-හරෙකි.

රේදෙව් සැළකුරු සිප් වදන් - 1

Aeriel ඇහැසිය
Air - condition (v) වා - සකසයි
Air - conditioner වා - සකසනය
Air - conditioning වා - සැකැස්ම
Alarm නැතිසන
Alarm circuit නැතිසන් සැරිය
Alarm, Visual දිසි නැතිසන
Alternating current, [A. C.] දෙපැති දහර, [දෙ. ද]
Ammeter ඇම්මනුව
Amperage ඇම්පියරතාව
Ampere ඇම්පියරය
Amplification තැරැසීම
Amplify (v) තරයයි
Amplifier තරයනය
Amplifier, A. F, ඇ. නි. තරයනය
Amplifier, Audio frequency ඇසි නිතැරියා තරයනය
Amplifier, Feedback පසුපොවන තරයනය
Amplifier, Intermediate Frequency අතුරු-මැදි නිතැරියා තරයනය
Amplifier, I F. අ. නි. තරයනය
Amplifier, L. C. coupled අ - පෙ. දූඩු තරයනය
Amplifier Magnetic කාන්දම් තරයනය
Amplifier, Multi - stage නෙක්පිය තරයනය
Amplifier, Radio frequency රේදෙව් නිතැ-රියා තරයනය
Amplifier, R. F. රේ. නි. තරයනය
Amplifier, Pentode පසදෙරු තරයනය
Amplifier, Power බල තරයනය
Amplifier, Pre - පෙරැ - තරයනය
Amplifier, R - C coupled රෝ - පෙ. දූඩු තරයනය
Amplifier, Transformer coupled තරාපැවි දූඩු තරයනය
Amplifier, Triode තෙදෙරු තරයනය
Amplitude තැරැසුව
Anode දනදෙර
Automatic සියසල
Banana - Plug (රඹ + ඔබුව) රඹොබුව
Banana - socket රඹ - කෙවුන
Beacon හිවිසන
Beacon, Radio රේදෙව් හිවිසන
Bell සීනුව
Bell, Alarm නැතිසන් සීනුව
Bell circuit සීනු සැරිය
Bias පසැදිය

Bias, Cathode රිණදෙරු පසැදිය
Bias, Voltage පසැදි වෝල්තතාව
Bias, Self සිය පසැදිය
Branch circuit අතු සැරිය
Breakdown (v) බිඳැවැටේ
Breakdown (n) බිඳැවැටුම
Bulb බුබුල
Bulbs බුබුළු
Bulb, Double contact දෙගටන බුබුල
Bulb, Filament බුබුළු කෙන්ද
Bulb Holder බුබුළු අල්ලුව
Bulb, Indicator ඉඟි බුබුල
Bulb, Single contact තනිගටන බුබුල
Buzz (v) ගුමයි
Buzzer ගුමුව
Cabinet පිරිපැස
Cabinet, Radio රේදෙව් පිරිපැස
Cable බහන
Cable, Service සේවා බහන
Capacitance පෙහෙවියාව
Capacitor පොහොනාව
Capacity පෙහෙවිය
Capacity, Inter - electrode තුරු - විදුදෙරු පෙහෙවිය
Carrier දරායැවි
Carreir communication දරායැවි සැලකුරුව
Carrier frequency දරායැවි නිතැරියාව
Cartridge fuse සුරටි පුලුසුව
Cathode රිණදෙර
Cathode bias රිණදෙරු පසැදිය
Cell සැල
Cell, Dry වියැළි සැල
Cell, primary පළමුවැරි සැල
Cell, Secondry දෙවැරි සැල
Charge (v) සුවසුරයි
Charge (n) සුවැසිරිය
Charger සුවසුරනය
Charged, Fully පුනු සුවැසිරු
Charged, Half අඩ සුවැසිරු
Changer, Frequency නිතැරියා මාරුකුරුව
Check (v) සරික්සයි
Checker (person) සරික්සු
Checker (Instrument) සරික්සනය
Checking සරික්සුම
Circuit සැරිය
Circuit board සැරි පුවරුව
Circuit. breaker සැරි සිඳුව
Circuit, Closed වැසි සැරිය
Circuit, Coupling දෑඳීම් සැරිය
Circuit, Open ඇරි සැරිය
Circuit, Short ලුහු සැරිය
Circulate (v) සිසාරයි
Circulating Current සිසැරුම් දහර
Circulation සිසැරුම
Circulator සිසාරවනය
Clamp (v) බදවයි
Clamp (n) බදවනය
Coil දරණය
Coil, Current දහර දරණය
Coil, Discharge සුවිසුරු දරණය
Coil, Induction අනුදනැවුම් දරණය
Coil, No-volt නො-වෝල්ත දරණය
Coil, Overcurrent ඉකුම්දහර දරණය
Coil, Regulating හසුරු දරණය
Cold - Cathode ඇල් - රිණ දෙර
Compass කොන්පවසුව
Compensating Winding හිලව් එතුම
Condenser, Reservoir රඳුර පොහොනාව
Condition report තතු සැළය
Conduct (v) පිරියවයි
Conductivity පිරියැවියාව
Conduction පිරියැවුම
Conductor පිරියවනය
Conductor, Bad දුපිරියවනය
Conductor, Good සුපිරියවනය
Conductor, Non නොපිරියවනය
Conduit අනුනළය
Confirm (v) තහවුරයි
Connect (v) අමුණයි
Connection ඇමිණිය
Connector අමුණුව
Connector, Claw පසුරු අමුණුව
Connector, Inter අතුරමුණුව .
Contact (n) ගටනය
Contact, Fixed නිසල ගටනය
Contact, Moving සල ගටනය
Contact, Sliding සැලැදි ගටනය
Continuity studio නොකැඩියා කලාගාර
Control desk පලු මැස්ස
Convert (v) පිරිවටයි
Convertor පිරිවටනය
Conveyor ඉසිලියැවිය

Cool (v) සිසිලවයි
Cooler (n) සිසිලවනය
Cooler, water දිය-සිසිලවනය
Cooling සිසිලුම
Cooling fan සිසිලුම් පංකාව
Cooling fin සිසිලුම් වරල
Coolİng jacket සිසිලුම් හැට්ටය
Cooling oil සිසිලුම් තෙල්
Cooling tower සිසිලුම් අටල්ල
Cooling towers සිසිලුම් අටලු
Cooling tube සිසිලුම් බටය
Cooling water සිසිලුම් දිය
Core හරය
Core, Four සිව්හර
Core, Multi නෙහර
Core, Single එක්හර
Core, Three තෙහර
Core, Two දෙහර
Corona කිරුළස
Corona voltmeter කිරුළස් වෝල්තම්නුව
Cost පිරිවැය
Cost of production නිපැයුම් පිරිවැය
Couple (v) දූදයි
Couple. (n) දූදිය
Coupling circuit දූදීම් පැරිය
Coupler දූදුව
Cradle ඊලය
Cradle guard ඊල රක්නය
Cross-modulation හරස්-පිරිහැනුම
Crystal සකැට
Crystal frequency සකැටි නිතැරියාව
Cubicle කිළිත්ත
Cubicle lights කිළිති පහන්
Current දහර
Current, Alternating [A. C] දෙපැති දහර
[දෙ. ද]
Current, Direct [D. C.] එපැති දහර [එ. ද.]
Cut glass කැට-කැද
Cut-off (v) සිඳැපියයි
Cut-off frequency සිඳැපියන නිතැරියාව
Control center මැදි පලු තැන
Cut-out (n) සිඳැහළුව
Cycle සකැළිය
Cycle frequency, Fifty පනස් සකැළි
නිතැරියාව

* * * *

'හෙළයන් අබිමුවැ - හෙළ අදහස් හෙළ බසින්
හෙළනු බැරි නම් කො තෙක් - පර බස් දත ද තුමට ය.?'

– කුමරතුඟු මුනිදස්

දුහුනු පබඳ

(දුහුනත් ගේ - ආධුනිකයන් ගේ - පබඳ සඳහා එඩිය රැකුලක් සපයයි. පහතැ පෙනෙනුයේ එ වැන්නෙකි. වෙසෙසින් මැ පාසල් සිසුවෝ මේ අවසරයෙන් වැඩ ගනිත් වා!)

I

හිඟන්නන් ගෙන් ආඩම්බරය

වි. වි. පෙරේරා

"අනේ, මහත්තයෝ! පිනට යමක් ලැබෙන්න."

"කෑ ගහන්න එපා, මහත්තයා නිදි. ඉඳ-පන් ටිකක්."

මෙ සේ කී අම්මා ගෙට ගොස් ලාච්චුව ඇර බැලුවා ය.

"මට බැහැ මෙ තැන පැල වෙන්න. මට තව කී තැනකට යන්න තියෙනවා ද?

මෙ සේ තොල් මතුරන්නට විය හිඟන්නා. එහෙත් කෝ හිඟන්නා! බැණෑ බැණෑ යනවා!

"මෙන්න මේක අර හිඟන්නාට දෙන්න පුතා!"

මම අම්මා දුන් සත පහ ගෙන ගොස් හිඟන්නාට දුන්නෙමි.

සත පහ විසි කළ හිඟන්නා බැණෑ බැණෑ ගියේ ය.

ගල්කිස්සේ
සා. තොමස්ස විද්‍යාහල

* * *

හිඟන්නා:- මහත්තයා මට සත දහයක් දෙන්නෑ තේ ටිකක් බොන්න.

ගෙ හිමියා:- ඇයි ද ඔබ රැකියාවක් නො කරන්නේ? මුදල් නො වෙයි ඔබට ඕනෑ; මෝළේ!

හිඟන්නා:- ඉතින්, මහත්තයා ළඟ ඇතැ යි කියා හිතුව දෙයක් නොවැ ඉල්ලන්න ඕනෑ.

II

වලගම්බා සිතිවිල්ල

දෙවිනුවර, කා. රූපසිංහ

(මහ කළු සිංහලයා පලා-යති යි ගිරි නම් නිගංඨයා කී බස් අසා වලගම්බා රජු දිවෙමින් සිතූ සිතිවිල්ල)

හොඳ යි, හොඳ යි, මම දුවන්නම්, ආයෙත් එන්නම් එ දට තේරේ වි, තටත් තගේ සොළී රැහැටත් සිංහලයා පසු බැස්සේ කුමකට ද කියා.

එම්බල ගිරිය, පැවිද්දකු වුවත් තෝත් තගේ හඩු රැහැට අයත් සියලු ගති ගුණ වලින් අඩු නැත්තෙකි. තට අපේ අග නුවර වන මේ අනුරාපුරේ පන්සලක් තනා දුන්නෝත් අපි වෙමු තට සිව් පසයෙන් අඩුවක් නැති වැ සුව සේ වැටෙන්නට මහ කපා-දුන්නෝත් අපි වෙමු. ඉතින් මෙහෙවූ අපට තෝ දුන් ගුණමකු වූවෙහි ය. මේක තගේ වරදෙක් නො වෙයි. තා අයත් ඔය හඩු රැගේ ගතිය තමා.

මේ රටට එන්නේ තුන්හිරි ගස්වල එල්ලීගෙන ආඩවනේ සාම් කියා නිවට නියාලු මූණක් පෙන්නාගෙන යි. එහෙත් යන්තම් වත් බලයක් ලැබුණොත් අලියන් වී, ඒත් මදි වී අපේ ඔළුවට අත හෝදන්න යි හදන්නේ! පරයා බව නො දැන කර පින්නා ගන්නට යැමේ වරද දුන් තමා තේරෙන්නේ!

නිවටය, අපට මතක යි, තොපේ රටින් ආ විජය නම් හොර දෙටුවකුට ඉහළින් ම සලකන්නට ගිය කුවේණිය නම් අපේ එකකට පත් හදිය. එයින් අපේ දූයේ මුදුන් මල් කඩ බඳු වූ රජ පෙළක් ම වැනැසුණා. සේන ගුත්තික කියන සොළී අස් නැවියන් දෙන්නා රජ මැඳුරේ නවත්වා ගෙන සාද සැලැකිලි කරන්නට ගිය සූරතිස් රජු ගේ හිසත් නැති වුණා. මුළු රට කල-කට හඩුවන් ගේ කෙළි මඩලක් වුණා. මෙහෙම තමා තොප කර පින්නා-ගත් හැම වර ම අපට වුණේ.

අපේ දෙටු ගැමුණු මහ පියා ගෙන් වත් තොපට හරි පාඩම ඉගෙන ගන්නට නො ලැබුණු බව යි මට නම් පෙනෙන්නේ! එළාර හටතින් ඉතිරි වුණු හඩුවන් නව සීයට යහතින් ගමට යන්නට අවසර දුන්නායින් නමා හෙළ දිවට මේ වර මේ විපත සිදු වුණේ ඉඳ-පියවූ, මා මේ වරටත් රැකුණොත් තොප ගේ වැල ගිය මුල ගිය තැන් බලබලා වැඩේ හරි පිළිවෙළට නො කළොත් එහෙනම් මේ ගැමුණු නො වෙයි ඔව්, ඒ දෙටු ගැමුණු අබා! මේ බල ගැමුණු අබා! බලවම් ගැමුණු ලේවල රගේ තොප කාටත්!

හෙළ බිම අපේ මව් බිම යි. මේ කප හට ගන්නේත් මේ බිමේ හෙළයා ගෙනි, කප නැති වන්නේත් මේ බිමේ හෙළයා ගෙනි. එම්බල, නිගංටය, හෙළ බිමේ අපෙන් යැපි-යැපී හිඳ සොළී කරේ තගේ තැයනට ඔත්තු සැපැයූ තට සුදුසු දඬුවම මම දෙන්නම්. තගේ ඔය පන්සල ම තට අමු අමුයේ දර සෑයක් කරවන්නම්. මෙ තැන අප ගේ කුල දේවතාවුනට සුදුසු මහ වෙහෙරක් මතු ඇති වෙනවා ඇති.

* * *

'කුඩාවුනට දෙවෙන දූය මහවුනට දෙවෙන දූයට වඩා පිරිසුදු බව පතා සිටී. එහි කිසි යම් නොපිරිසුදු බවෙක් වේ නම් එය කල් තබා මැ අස් කැර-ලීම දෙන්නහු ගේ ලොකු මැ යුතු කම වෙයි.'

– ජයන්ත වීරසේකර
(එළිය 1 වෙළුම 12 කලඹ)

සැරැලීම

සඳදස් කෝපරහේවා

අපේ හැම කලා කටයුත්තෙකැ මැ ඉතා පැහැදිලි වැ පෙනෙන ලකුණෙකි, සරල බව. ඒ කිසියම් දෙයක් ලුහුඬින් සැකෙවින් පැවැසීම යි. හෙළ ආරේ උසස් මැ ලකුණු අතුරැ, සැරැලීමට ලැබෙත්තේ ඉහළ මැ තැනෙකි

ලොවැ හැම කලා කමෙකැ තැනැති විසින් තැනැත්තතටත්, පොදුවේ, ඒ රැසටත් හුරැ - පුරුදු කිසියම් අමුතු ගතියෙක් වෙයි. ඒ අමුතු ගතිය, තැනැත්තකු ගේ කලා කැරැමෙකැ ඉස්මතු වන විටැ, අපි එය 'ආර' නමින් හඳුන්වමු. ගුරුළුගෝමින් ගේ බස් ආර, ඈ විසින් අපි එය සඳහන්තට හුරැ - පුරුදු වී ඇත්තම්හ පොදුවේ රැස විසින් ගත්තත්, හෙළ රැසේ ආර, හෙළ බස් ආර, හෙළ සිත්තම් ආර, ඈ විසින් අපි එය සලකමු ඒ ඒ රැසට අයත් වෙසෙසි ගතිය හෝ තැනැත්තකුට අයත් වෙසෙසි ගතිය හෝ සැලැකෙන විටැ යැ මේ ආර ඉලිප්පි පෙනෙත්තේ. ආර නම් මිනිසා යැ යි පැළ දිගැ පඬුවකු විසින් ද සැලැකුණේ මේ අදහස මැ තහවුරැ කරත්නට යැ යි සිතේ. හෙළ රැසට අයත් නියම ගති ගුණ සියලු අතින් නපිරෙන විටැ යැ මේ ආර සැකැසුණා නම් වත්තේ. පොදුවේ රැසෙකැ හෝ, තැනැති විසින් තැනැත්තකු ගේ හෝ මේ 'ආර' පැහැදිලි වැ පෙනෙන විටැ, එය උසස් කලා කමෙකා, ඉතා සැලැකියැ යුතු, ඇවැසි සලකුණක් ලෙස සියලු මැ විචාරුවෝ සලකත් නිසග බව, පණවත් බව, නොවක් බව, සිත් අදිනා බව, නිතැතින් මතු වන ගුණ ඇති බව ආදිය නිසා, කලා කැරැමෙකැ පුහුල් තාවය කැපී පෙනෙයි එහෙත්, ඇතැම් කලා කැරැමෙකැ, මේ පුහුල් තාවය මැඬැ, කලා අරමුණ මැ ඉස්මතු වෙයි. මේ දෙ වැදූරුම් ගුණය මැ දක්වන කලා කැරුම් ඇත්තේ යි.

මෙයට ඉදුරා වෙනස් වූ නව ද කලා විදියෙක් වෙයි. එය කලා 'අනුරුව' යනුයෙන් හැඳින්වේ. කෙනකු කතා කරන අනුරුව, යන - එන අනුරුව, හිඳිනා - සිටිනා අනුරුව, යනු කියන විටැ ඔබට එය වැටැහෙනී අපි සලකමු. අද කලා කැරුම් වෙසින් අප හමුවට එත්තේ, බොහෝ විටැ, මේ කලා අනුරුව යි. උසස් කලා කරුවකු විසින් නිමැවුණු සිත්තමෙක් වේ වා, හැඹුමෙක් වේ වා, නව පැබැඳුමෙක් හෝ කවෙක් හෝ වේ වා එ සේත් නැති නම්, ඉම්හිරි සගයුවෙක් හෝ වේ වා, ඒ වෙළපත්නට බලන කි දෙනෙක් අපේ රටේ වෙත් ද? වෙන රටවලැ ද ඒ එ සේ මැ යි එහෙත්, එය අපේ රටේ තරම් දරුණු නො වේ. වෙසෙසින් අපේ සරසවි ඇදුරන් ගේ අත් පහස ලැබැ එළි දක්නා පත - පොතේ මේ ගුණය වෙසෙසින් පෙනේ. අපේ සිතමාව, සගයුව ආදිය මේ අතින් උසුලන තතුව, සැබැවින් මැ අවැඩකුරැ යැ.

'කොට එළ දෙතත් දිවෙනා වාලේ පස්සේ
තු ට වඩමින් දිව්වා යන තුරැ රිස්සේ
පි ට රට සිරිත අනුව ම ගොස් ඒ ලෙස්සේ
ය ට වුණු උගුලෙ සිහළුන් ගේ හියෙ රිස්සේ'

යනුයෙන් එක්තරා වැඩිහිටියකු කියේ මේ කරුණු සලකා වියැ යුතු යි.

'පර දෙස් වැඳැ වැඳැ
පර රැසට ගැති කම් පැ
පර බස් රෙසෙත් මත් වැ
ගෙ දෙර පවා රකිනු බැරි'

යනුයෙන් කුමරතුඟු මුනිදසුන් විසින් කියැවුණේ මේ අනුරුව, වෙළැපීමේ නරක පල යැ. මෙ සේ කවර විදියෙකැ හෝ අනු-රුවෙකින් රැසෙකැ හෝ පුහුලකු ගේ හෝ වෙසරදු බව (Genius) පහළ නො වේ.

හෙළ ආරේ, වෙසෙසි ලකුණ සැරැලීම යනුවෙන් අප විසින් මුලැ දී සැඳැහිණි. අවුරුදු දහස් ගණනක් තිස්සේ පරපුරෙන් පරපුරට සැකැසුණු, වැවුණු, වැඩුණු ඒ උසස් කලා ගතිය - ආදි හෙළයන් ගේ බසින් ද, ලිවිසැරියෙන් ද, සිත්තමින් ද, හැඹුමෙන් ද, හටවුවෙන් ද සගයුවෙන් ද, නැටුමෙන් ද, පණ පෙවුණු ඒ වෙසෙසි ගතිය - අපට සොම්නස දනවමින් දුනුදු පණ ගසමින් පවතී. මේ පිළිබඳ කරුණු එක් රැස් කොටැ,

සියල්ල වගයා මහ ගතක් වුව ද ලියැ හැකි යැ. මෙහි ලා අප විසින් දක්වෙන්නේ එහි කරුණු කිහිපයක් පමණෙකි.

මිනිසාත් සබා දහමත් අතර ඇති ගැටුම් නිසා හෝ, මිනිසාත් මිනිසාත් අතර ඇති ගැටුම් නිසා හෝ, ලිවිසැරිය පහළ වූ බවක් දැවිත් විසාරදයෝ කියති. සබා දහමේ ඇති සිත් අදනා ගුණයට හෝ සිත් අවුසුවන ගුණයට හෝ ගැටෙන පස් ඉඳුරන් ගේ පිළි - කැරුම් නිසා නැඟුණු හැඟුම් මනස් සිත්තම් පටේ නන් අයුරු රටා ඇති කෙරේ. ලොව නන් අයුරු යැ. මිනිසා සත් අයුරු යැ. එ හෙයින් මැ, ඔවුන් විසින් වැවෙන කලා කම් ද නන් අයුරු වේ මැ යි. ලොවේ විසිතුරු බව ඇති වන්නේ, මේ නන් අයුරු බව නිසා මැ යි. මිනිසුන් ගේ බුන් පිසි බව ඇති වන්නේත් මේ විසිතුරු බව නිසා යි.

සබා දහමේ ඇති විසිතුර, මෙ සේ උලුප්පා ලුහුඩින් පෑම 'සැරැලීම' යනුවෙන් හැඳින්වේ. මේ සැරැලීම් අපේ හැම උසස් කලා කට-යුත්තකට මැ අයිති එකෙකි. නකත් ඇදුරන් විසින් ලියැවෙන කේන්දර පිටපත්හි ඇත්තේ ද එක්තරා දියමිතියනු (Geometrical Simplification) සැරැලීමෙකි. කෙනකු ගේ පලා - පල කීමෙහි දී එහි ඇති විතර කො තරම් මහත් දැ යි ඔබට පෙනෙනු ඇති. වෙද ඇදුරන් විසින් නියම කැරෙන අරක්කු (අර්ක) ආදියෙහි ද ඇත්තේ එක්තරා විදියෙකැ සැරැලීමෙකි. සැරැලීම අතින් හෙළ බස තරම් පොහොසත් බසක් ලොවැ නැති සේ පෙනේ. 'සැරැලීම' මේ යැ යි දක්වන කැට-පතක් බඳු යැ හෙළ බස. සිකවලඳ විනිස, දම්පියා අටුවා ගැට පදය, අමාවතුර, සිඟිරි කුරුටු ගී, කව්සිළුමිණ, ආදිය ද එයට දෙස් සපයන සැටි සැබැවින් මැ විස්ම - කුරු යැ.

අපේ සිත්තම්හි ද, ඇඹුණු බුදු පිළිමෙහි ද, කැපුණු කැටයම්හි ද, කට වහරේ එන ඇතැම් කියමන්හි ද, මේ සරල බව පෙනේ. සමහර තන්හි ඇත්තේ, නිකම් මැ සරල බවෙකි; කලා හුරු මැවුම්කුරු සරල බවෙක් නො වේ. 'අන්නාසි මල' යනුයෙන් බිතු සිතුවම්හි පෙනෙන, සිත්තම් රටාව, මෙ බඳු සැරැලීමක් දක්වන්නෙකි. අන්නාසි මලක් දිහා බැලූ කලා කරුවකු සිතේ, ඒ නිසා හට ගැනුණු මනස් සිත්තම් රටාවේ නුවූවමනා කොටස් කපා, සැකැසීමෙන් වඩා ලා මැ සරල බවට පැමිණුණු පිරිසිදු රුව යැ 'අන්නාසි මල' නම් : මුල් පියෙවි රුව, වෙනසීමෙන්, පිළිවෙළීමෙන්, හැඩ ගැස්වීමෙන්, ලයක් අනුවැ සැරැසීමෙන්, සැකැසුණු එක්තරා මනහර රටාවෙකි ඒ; බොහෝ දුරට රේකා-වලින් මැ යුතු - රේකාවටන් ලයටන් මුල් තැන් දුන් - අන්නාසි මලේ සැකැසුණු පැති පෙනුමෙකි. දිය සුළි පෙණ බුබුළු තටවා, දහරන දිය දහර විදැකීමෙන්, සිතේ ඇති වුණු ලයහුරු කලාහුරු හැඟුම, ඇසීමේ ලය, දැකීමේ ලය, විඳීමේ ලය, යන ආ විසින් විදහන් වැ, ලය මැ උලුප්පන සේ පිළියෙළ වුණු ලුහුඬු සටහනෙකි, බිතු සිතුවම්හි පළ වැ පෙනෙන තිරිඟි තලය. නෙළුම් පොකුණක් දැකීමෙන් සිතේ ඇති වුණු රසවත් කලා හැඟුම, ලුහුඬු කලා රටාවෙකින් දක්වන්නට කළ වෑයමෙකි, පත්සල් බිතු සිතුවම්හි පැනෙන මනහර නෙළුම් මල් රටාව නෙළුම් මලක් දැකීමෙන්, එහි කඩවසම, ලය, රටාහුරු දියමිතියනු සරූපය ආදිය දක්-වන්නට තැනුණෙකි, පොළොන්නරුවේ පිහිටා ඇති 'නෙළුම් පොකුණ' අනුරා පුර මහ මේ වෙනේ, ගොළු නීසැලියාගේ ගැලෙමින් සිටැ ද, අපේ මනසේ මත් සැඟි දසුන් මවා, අප සමාදියේ හිඳුවන සමාදි පිළිමය පිළිබිඹු කරන මහ මහිමය කිමෙක් ද?.

ගලින් නෙළුණු බුදු පිළිමයෙන් පිළිබිඹු වන්නේ ද ලොව්තුරු ඉරියව්වේ සරල සලකුණෙකි හතුමා වන් රහ, ආදියෙන් ද, පළ වන්නේ, අර සතුන් ගේ ලයහුරු ඉරි-යව්වලැ ලුහුඬු රුගුම යි. අපේ කට වහරේ පවතින, වැඩියක් මැ කුඩාවුත් අතර පළ ගැමි ළමා කව් පෙළින් පළ වන්නේත් එය යි.

'ග ග ක් උඩ ගෙඩියක්
ගෙඩියක් උඩ ගහක්' -

අන්නාසි ගෙඩියේ පැහැදිලි ගති සලකුණු පමණක් මැ තෝරා, කෙටියෙන් කියූ සැටි බලන්නැ.

'අක්තක් උඩැ බුම්මා - ගෙනැ
කටු රෙද්දක් පොරවා - ගෙනැ'

කොස් ගෙඩියක් දිගා බැලීමෙන් සිතේ ඇති වුණු දළ කටු සටහන හෙවත් පිටස්තර පැහැදිලි පෙනුම කෙටියෙන් කී සැටි යැ ඒ.

'ගලක් පලා ගලක් දිටිමි
එ ගල පළා වතුර දිටිමි
වතුර යටින් රිදී දිටිමි'

මෙහි සැකෙවින් පැවැසූ සැටි පළ යැ. මේ සැරැලීම ඉතා මනහර අයුරින් දක්වන තැනෙක් සැළ ලිහිණි සඳෙසේ එයි.

සුනිල් වලා, නව සඳ, තිලුපුල්, පබළු
විමල් සක්, ගිජිඳු කුඹු, සිරිවස බැබැළු
විපුල් පුලින, රඹ, සිකි ගල, මුතු, ල - දළු
ලකල් රඟ ලියක්, සරනා බල යහළු

ඉතා තිල් පාට වලා කුළු, අලුත් සඳ, තිල් මහනෙල්, පබළු, පිරිසිදු හක් ගෙඩි, ඇත් කුඹු, බබලන උඩැක්කි, මහත් වැලි තලා, කෙසෙල් කඳ, මොනර කර, මුතු, ලා දළු, ඇවිදින රන් වැල්.

මේ සැරැලීමෙන් දැක්වුණේ කිමෙක් ද? එ සේ දැක්වුණු දෑ වෙන් වෙන් වැ ගෙනැ වගයා බලමු.

1. ඉතා තිල් පාට වලා කුළු – කෙස් වැටිය
2. අලුත් සඳ – නළල
3. තිල් මානෙල් – ඇස් දෙක
4. පබළු – තොල්
5. හක් ගෙඩි – බෙල්ල
6. ඇත් කුඹු – පියොවුරු
7. උඩැක්කිය – හීන් ඉඟ
8. වැලි තලා – උකුළ
9. කෙසෙල් කඳ – වටොර
10. මොනර කර – කොංඩ
11. මුතු – නිය
12. ලා දළු – අතුල් පතුල්
13. රන් වැල් – ගැහැනු සිරුර.

'ඉතා තිල් පාට වලා කුළු' කියා කිවා මැ කෙස් කලඹ හුඟක් තිල් බවත්, .ලොකු බවත් ඇඟැවෙයි. 'නව සඳ' යැ කියා කීවා මැ නළල පටු බව ඇඟැවෙයි. 'පබළු' යනුවෙන් සැඳැහීමෙන්, තොල් ඉතා රතු බව දැක්විණි. 'සක්ගෙඩි' යනුවෙන් දැක්වුණේ බෙල්ල අඩුවක් නැති වැ පිරුණු බවෙකි. එහි නව ද තුන් ඉරි රැඳි තුබුණු බවෙකි. 'ඇත් කුඹු' ලෙසින් පැවැසුණේ පියයුරු මහත් බව යැ; පිරුණු බව යැ. සිහින් ඉඟ, 'උඩැක්කිය' යනුයෙන් දැක්විණි. උකුළ, 'වැලි තලා' ලෙස දැක්විණි වටොරේ පිරිපුන් බව ද, සිනිඳු බව ද, 'කෙසෙල් කඳින්' දැක්විණි. කොංඩේ සිහින් බව 'මොනර කර' අයුරින් ගැනිණි. නියපොතුවලැ දිමුතු බව ද, පිරිසුදු බව ද 'මුතු' යන්නෙන් ඉස්මතු විණි. අතුල් 'පතුල්හි' ඇති මොළකැටි බව ද, රතු බව ද, 'ලා දළු' ලෙසින් ගැනිණි. සිහින් රන් වන් සිරුරේ ලයහුරු අයුරුව, 'රන් වැල්' යන්නෙන් හැඟැවිණි.

රසහුරුවන් ගේත්, කම්හුරු අරමුණු ඇසියන් ගේත් සිත් රසවත් කරනසුලු අවුසුවනසුලු, රුවෙකැ පැහැදිලි කොටස් වෙන් වැ ගෙනැ, එහි පියකරු බව, කො තරම් කෙටියෙන් පැවැසිණි ද? එහි රසවත් ගතියත්, කලාහුරු මුහුණුවරත්, කො තරම් මනහර ලෙසින් සැලැසිණි ද? මෙසින් දැක්වුණේ, ලලන රුවෙකැ බැහැරි පෙනුමේ සැරැලීමෙකි. රුවෙකැ, බැහැරි සැරැලීම මෙන් මැ ඇතුළු සැරැලීම දැක්වෙන තැන් ද වෙයි. මේ පැදියත් අපි විමසා බලමු.

වෙසෙසින් පහන් පැහැසර
ගැඹුරු පිවිතුරු
බැලුවත් ඇලුම් කරවන
යළි දූ බියකරු
සිරිපින් රුවත් පිරි එසුරිඳු
සයුරු සුරු
මුවෙකින් කියා නිමැවියැ
හැකි ද රූ සිරු

දෙව් රජ කුමක් වැනි ද? දෙව් රජ සයුරක් සරි යැ. දෙව් රජ පහන් යැ. සයුරත් පහන් යැ. දිලිසීමෙන් යුතු යැ. දෙව් රජ සිරියෙන් යුතු යැ. පින් ලකුණෙන් ද, සිරුරේ පැහැයෙන් ද, පිරුණේ යැ. සයුර සිරි කත ගෙන් ද, මඟුලැ යි සම්මත රුවනින් ද හොබනේ යැ. මෙහි යෙදුණු වෙසෙසුන් දෙව් රජු හටත්, සයුරටත්, සරිලන ලෙසින් ලුහුඬින් දැක්වුණු සැටි බැලුව මැනැවි.

1. මෙහි මුලින් සැඳැහුණු 'පහන්' යන වදනින් ඉලිප්පුණේ පැහැදිලි වැ පෙනෙන

ගතිය යි. දෙව් රජ සයුර සෙයින් මැ පැහැදිලි වැ පෙනේ. එහි පහන් බවට හෙවත් සතුටු බවට පත් යන අරුතෙක් ද ඉස්මතු වේ.

2. 'පැහැසර' යන වදනින්, දෙව් රජු ද සාගරය ද, කාන්තියෙන් යුත් බව කියැවිණි.

3. 'ගැඹුරු' යන වදනින්, මිනියැ නොහැකි ගැඹුරු බවත්, නුවණත් පැවැසිණි. එ සෙයින් මැ සයුරේ ගැඹුරු බව ද, පැවැසිණ.

4. 'පිවිතුරු' යන වදනින් දෙව් රජු බොහෝ දුරට නරක ඇසුරින්නුත් සිත කිලුටු කරන කෙලෙස්වලින්නුත් දුරු වැ පිරිසුදු වැ සිටුනා බව ඇඟැවිණි. අපිරිසුදු දෑය පිරිසුදු කරන හෙයින් සයුර ද පිරිසුදු යැ.

5. 'බැලුවන් ඇලුම් කරවන' 'යළි දු බියකරු' යන වැකියෙන් දෙව් රජු ද, සයුර ද, පැහැසර, පිරිසුදු, ගුණයෙන් යුතු බව කියැවෙයි. ගැඹුරු ගුණය නිසා දෙ පැත්ත මැ බියකුරු යැ. තෙද, බල, විකුම් නිසා දෙව් රද බියකුරු යැ. මෝර ඈ මසුන් නිසා ද, දිය සුළි, දිය වැල්, ආදිය නිසා ද, සයුරත් බියකුරු යැ, මුලින් සැදැහුණු සියලු කරුණු සැරැලීමෙන් දක්වුණු සැටි කො තරම් අපූරු ද?

(සියලු හිමි කම් ඇවිරිණි)

වදන් වැල

සැරැලීම - සරල කිරීම. Simplification
පුහුල්කාව - Personality
අයුරුව - Mannerism
වෙළපත්නට - To imitate
පිළිකැරුම - Reactions
පිරිසුදු රුව - Pure form
දහරන - Flowing
(දහරා, දහරති - දැහැරී, දැහැරු)
ලයහුරු - Rhythmic
කඩවසම - Symmetry

* * * *

ගෙ-හිමියා:- බලන්නැ කොතරම් මිහිරි ද පන්සලෙන් නැහෙන සීනු හඬ?

අමුත්තා:- ඔබ කියන කිසිවක් ඇහෙන්නේ නැ නොවැ අර මළ - ඉලවු සීනු හඬ නිසා!

අපේ මඟ

අමරසිරි ගුණවඩු

කවර මඟ ද ඒ? **කුමරතුඟු බස් මඟ!** ඒ නම් අපේ මඟ. **කුමරතුඟු බස් මඟ** නම් කිම? **හෙළ රුසේ** සියත් බව දක්වා දෙන එක් ලකුණ සෙයින් සැලැකෙන වහර තකා **කුමරතුඟු මුනිදස් ගුරු දෙවියන්** විසින් පහසා දුන් බස් **හසර** යි! මේ එළි සකසුවන් ගන්නා මඟ එහි ලා තිදසුන් විසින් සැලැකුව සරි යැ. සිය බස් මඟ අතින් **මුනිදසුන්** තමන් පිළිගත් අනුදත් පිළිවෙත් නය එ පසට මෙ පසට නො ඇල වැ ලෙන් දරා පිළිපදිමින් බස් කිසට අත් සිත් දෙන තාක් දෙනා යැ 'අපේ මඟ' යන මෙහි ඉඳුරා ඉදිනුවෝ. ඔහු **ගුරු දෙව්** අග සවු **විරුසේකර ජයත්** ඇජරත් ආදි කොටැ සිටියාහු මැ වෙත්.

ගොයුම් බුදු රදුන් අසර සසර වන් ලෙවන් විදුනා අතත් දුක් පසක් කොටැ පියා **සිවු සස් එළියෙන් නිවන්** මං පහයන්නට වන් මැ **නුවමුවෝ** 'අපි තටුවම්හ' යි වග බැඳැ සරස් වැ හඬා ගියෝ යැ. එසින් නො නැවැත්තහ **බුදුහු**. **උතුරු මිනිසි** පෙළේ තිසි බල බැවින් ලොවුතුරා බුදුන් හැම තුවට සරස් මැඬැ ලෙවන් අතට නිවන් සුව දෙන **දහම්** මඟ සඳ වදළා මැ වේ ද! **මුනිදසුන් බස් සස්** එළිය පාන්නට වන් තන්හි තිවටයෝ තමන් තන් තැති වෙති යි ඇලැලී ගිය බිය බැවින් සරස් වැ නන් හඬ හඬා දස අතින් හොල්මන් කරන්නට වූ යැ. **උතුරු මිනිසි** බල නැත ද තිසි මිතිසි බල පුරා ඇති **මුනිදස්හු** හැම තිවට සරස් සිඳැ බිඳැ බස් එළිය දල්වා **රුසම** පිටු බල සපයා මැ සිටියහ. **හෙළ දිව පුරා** දුන් මේ පෙනෙනුයේ ඔවුන් **දල්වූ ඒ එළිය** යි! පැයෙන් පැයට දිනෙන් දිනට මසින් මසට වසින් වසට ඒ වැඩියෙන් මැ පෙනේ. එ අතින් වෙසෙසින් කැපි පෙනෙන දූයෙක් නම් එ ද, සරසට සිටි තිවට පෙළේ බොහෝ දෙනා ද අද මුනිදස් බස් **එළි** පිහිට ලැබීම යි!

බුදු රදුන් සැබැව දූකැ වදුරා දක්වා වදුරන්නට වූ යැ. ලෙවන් සුව තකා මැ වේ ද ඒ? **මුනිදස්හු ද බුදුන්** අනුවැ ගත් හ. ඔවුන් මුලින් **බස් සස්** පසක් කොටැ ඉක්බිති පසක් කරවන්නට වන් සැටි මැනැවින් පතළ යි **හෙළ රුසේ** හිත පතා මැ යැ ඒ! **මුනිදසුන්** සස් දසුන් මතින් බස් පිළිමලුන් පසුන් කරන්නට වූයේ තිගැනුම් පැසැසුම් සිහිනෙනුදු ගණන් ගැනුම් පියා මැ යැ. එ සේ ඔවුන් පහයා මතු කළ **බස් සස්** කසුන් රුව දූනුදු පට පඹ පෙළේ බොළඳුන් අතින් කළු වන්නා දක්නා මැ නුවණින් දූනුමෙන් පිරිපුන් මැදහත් වියත්හු සිය ගුණ බණ දිව් දළින් ගළමින් ඔපයා පාන මාන බලත්. බස් ලැදියනට ඒ අස්වස් යැ!

මුනිදස් බස් සවිය අපට කොයින් ද? සැබැවින් මැ අන් කාට ද ඒ ඇත්තේ? එ සා දිගු කල් සිය ඇසුරේ දවස් යැවූ එ තරම් **විරුසේකර ජයත්** ඇජරාණෝත් තමන් එ අතින් **ගුරු දෙවියන්** අසල් වන්නට වත් නොවන් සේ තුමූ මැ පිළිගත් හ; පැවැසූ හ. ඉතින් **කුමරතුඟු** මඟ ඉඳුරා ගත්තවුන් අතර දුන් ගැණෙන තුඹුවන් තකා කියනු කිම? ඒ එ සේ යැ. එහෙත් සිය මඟ ලෙන් ගතුවන් කෙරේ **ගුරු දෙවියන්** සඳ ඇති කළ සවියෙක් නම් ඇත් මැ යැ. **බස් ඇලුම් සවිය යි.** එ නම් මෙර ගල සෙයින් නොසල දූයෙකි! **හෙළ** බස් දූනුම අතින් සරසවි වදුරු කමකට තබා එ පිල පිස්නා තරම් වත් නොතිසි පට පඹයන් වල් සුත් සිවල් වල්ලේ බණ බැණැ අව ද බස් කළුවට සිහිනෙනුදු ඉඩ නොවඩන බස් ලැදියෝ වෙති එයින්!

යන්නේ කොයි ද? කියුන්නේ කිම් ද යනු දූ නො දූනැ **හෙළ බස්** උයන් පාළුවට බට දුඹුල් පට සත්තු දූනුත් දක්නා ලැබෙත්. උන් අතර 'මුවෝ අං කැය්සූ සේකැ' යි යෙන්නෝ ද වෙත්. ඇසිරිය නම් එ වැන්නනුන් බස් **ලිවිසැඹි** කිසේ ඇඹිලි ගසන්නට තරම් නොවිළි වීම යි! උන් තබා එ ද **හෙළ ලිවිසැඹියට** මහත් අත් වූ හෙළ බස් **සක්විති ගුරුළු දූමි** මඟ ඇජරත් **'දූමියෙමි'** යි හඬ ගෙනැ මෙ ද බසට නොහිත බසකට

නෑගුණ ද හෙළා මැ මුත් නො හෙළා තම නොරදනා එළි දැළි බස් ළැදියෝ අපේ මගේ වෙත් මැ යි. යම් යම් පිසි පුරාගැන්මේ පරම'රුතින් **හුදු ලිවිසැරිය** සැබැවින් මැ නො හැඳිනැ අනත් මනත් බෙණෙමින් නියම වියතුන් හෙළා **දක්මින්** නුනුවණුන් මැදූ මැජැඹුම් පතා **'ඉංගිරිසි, රුසියානු'** ඈ **'විජ්ජා'** මගින් නැත් ගැන්මේ නැත් ඇත්තෝ කවර අවසර ලැබෙත් ද? ඔය නිකම් පුහු 'විජ්ජා' හැළැවිලි පිහිට ලැබෙතොත් ඒ ලැබෙනුයේ කිසියම් පවුල් කුලපති අනෙකින් මිනා වෙත කි නම් අතින් ද? එ සේ බැවින් එ නෙක් 'විජ්ජා' එ වැන්නන් මැ සොයා දක්වා දීම ලගතේ යැ

ගුරු දෙවි **මුනිදස්ගු** කවුරු හෝ සවි පමණින් බස් මෙහෙයන් කරත්නාහු වෙත් නම් ඔවුන් නියතින් මැ තමනුදු සගත්තවුන් මෙත් හැම කල්හි දුට හ, නැනූ හ. මුළු හෙළ **රැස** අතින් ඔවුන් ගේ එක් මැ පැතුම වූයේ. එ පමණ යි එ වග තදට හදට ගත් අපේ මගේ හෙළයෝ කවර කතුරු සරස් අතර වුව ද දිරි ඉදිරි කැරැ එළි දැළි කැරැ බස සැගැනීමෙ හැම වැර දරත්. එයින් ඔහු මහ යුතු කමක් කෙරෙත් තමනට **බස් එළිය** දුන් **ගුරු දෙවියනවක් රැසටක** යැ ඒ! **බස් එළි** මහිමයෙන් **රැසට** අත් ලා දුන් ඔවුන් අතින් සිදු වූ වැනුම් හිමි ඉකුම්වා සිටුනා සේවාව සැබැවින් මැ අගයා තමන් සමරමින් බුහුමන් කරන කරනු පතන සියලු හෙළයෝත් බස් වගාවට පිළිසරණ වන පමණට කුලුණුමත් වෙත් නම් තුමූත් මුළු මතින් **මුනිදසුන්** සගත්තෝ යැ. **අපේ** මග ඉදුරා ගත්තාහු ද එයට හිතින් මැ දයාබර වූවාහු ද එ සඳහන් කරවා ඇත්තාහු වෙත් වා!

* * * *

රහ වරු දෙසුමා:– රා කළයකුයි පැන් **කළයකුයි** දුන්නොත් බූරුවා බොන්නේ කිනම් කළයෙක් ද?

අසන්නා:– පැන් කළයෙන් මැ යි

දෙසුවා:– බොහො මැ හරි, **ඒ** ඇයි?

අසන්නා:– ඌ බූරුවා නිසා නේ?

හෙළ සඳ

(W. D.) සිල්වා

'හෙළු' සඳ ලංකා යන්න මෙන් මැ කවර දිනයෙකැ වහරට ආයේ දැ යි තව මැ නිනව් නුදුටු කරුණෙකි. මහවසින් (මහා-වංසයෙන්) මැ යටගියාව උගන්නට වන් නිසා යැ ඒ.

'හෙළු' සඳ 'සිංහල' යන සකු වදනින් බිඳුණක් සේ සලකති ඇතැමෙක්. එහෙත් පාලි පොත්හි එන සීහළ යන්න සකු සිංහල යන්නට වඩා පැරැණි යැ යි සිතියැ හැක්කේ පාලි ගත්, බුදු දහම මෙහි පැතුරුණු අවදියේ සිටැ තුබුණු බව සලකන විටැ යැ.

එහෙත් කිතු වසින් පෙර 800 පමණේ දී ලියැවුණු සේ සැලැකෙන 'ශතපථ බ්‍රාහ්මණ-යෙහි' දඹදිවැ විසූ අසුරයන් හෙළයන් යැ යි කියාගත් බව සඳහන් වෙයි. පසු වැ බමුණන් ඒ වදන නො වටහාගෙනැ අනෙක් නොයෙක් වදන්වලැ අරුත් මෙන් මැ වරදවා අරුත් කී බව සැබැවි.

පැළ දිගැ යවන බසෙහි 'හෙළ' යන්නෙන් මිනිස් වගක් හැඳින්වෙන නිසා ද ඒ හෙළ සඳ මුල් වරට පොත් ගැන්වුණු දිනය සේ සැලැකියැ හැක්කේ යි.

හෙළ සඳෙහි අරුත ද ඉතා පළ යැ. මේ දිවැ විසූ මිනිසුන් හෙළයන් වූ හෙයින් ඔවුන් ගේ පාට ද ඒ හෙළ නමින් මැ ගැනුණු සේ පෙනේ. පැරැකුම්බා සිරිතෙහි 'පැරැකුම් රජ හේම පාට' යන්නෙන් ද හෙළයා ගේ පාට විතර වෙයි. ඒ සඳහා ලතින ඈ බසින් උදව් ද අපට ලැබේ. ලතින HELUS යන්න ද ලිතුවේනියන් බසෙහි ZELU යන්න ද පරණ ජරමන බසෙහි gee GELLO යන්න ද රන් පැහැය හඳුන්වයි. (දිගට පළ වෙයි.)

* * *

බක් මස

පුන ගැසිය {
සැරදේ බක් මාසේ
සුරුදේ බක් මාසේ
වොරුදේ බක් මාසේ
සිරි බර බක් මාසේ
}

1. බමරුන් පිස්සු වැටිලා මල් ගස් සිඹැ සිඹැ යන මාසේ
පල බර ගස් වැල් දත් සැල් සරසා සියොතුන් කැඳවන මාසේ

2. ලේනුන් පලවා අඹ ගහ මුදුනේ ටකය බැඳෙන මාසේ
ජම්බු ගහට වදුරන් වළකාලා පඹයින් නැඟිටින මාසේ

3. සිල් ගත් වවුලන් මත් රස දුරුලා පල වැළ කන මාසේ
හුළු අතු බැඳැ රෑ යාමේ පිබිදී කොලුවන් කජු ඇහිඳින මාසේ

4. කුහු කුහු යැ යි කොහා උඩගු වී තලා පිඹින මාසේ
තැනැ තැනැ පොඩි ළමයින් තරගෙට ඒ හූවට හූ දෙන මාසේ

5. පිදී වළලු ලෙලවාලා ගැහැනුන් රබන් වයන මාසේ
'මේ සත පහටත් පොරෝවැ' යි පිරිමින් 'බණ පොත' පෙරළන මාසේ

6. කැවුම් කෙහෙල් ගෙඩි සුවඳ සුළඟ හා රට වටැ යන මාසේ
කොල්ලන්, කෙල්ලන් සෙල්ලම් සඳහා උමතු කරන බක් මාසේ

එළියට පැබැදුම් මෙ සේ එවුව මැනැවි.

ගල්කිස්සේ.

හුළුදගොඩ පාරේ 20/1

එළිය සකසුවෝ.